# 4 කර්මාන්ත

## 4.1 සමස්ත ක්‍රියාකාරීත්වය හා උපනතීන්

කම්හල් කර්මාන්ත අංශයෙහි නිෂ්පාදන පදනම් කරගෙන ගණනය කරන ලද කාර්මික නිමැවුම 2002 දී අත්කර ගත් සියයට 2.8 ක වර්ධනයට සාපේක්ෂව 2003 දී මූර්ත වශයෙන් සියයට 4.6 කින් වර්ධනය විය. නාමික වශයෙන් කාර්මික නිමැවුම සියයට 10.3 කින් වර්ධනය වූ අතර ඒ අනුව 2003 දී කම්හල් කර්මාන්ත අංශයේ ගම්‍ය මිල දර්ශකය සියයට 5.4 ක් විය. නිෂ්පාදන අංශයෙන් සියයට 81 කට දායක වූ කම්හල් කර්මාන්ත අංශය 2003 දී සමස්ත ආර්ථික වර්ධනයට සියයට 10.5 කින් දායක විය.

2003 දී කාර්මික නිමැවුමේ වර්ධනය, පෞද්ගලික අංශයේ කර්මාන්ත සියයට 5.2 කින් වර්ධනය වීමෙහි සහ රාජ්‍ය අංශයේ කර්මාන්ත සියයට 7.1 කින් පහත වැටීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. 2003 දී කම්හල් කර්මාන්ත අංශය තුළ පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්හි දායකත්වය පිළිවෙලින් සියයට 96 ක් සහ සියයට 4 ක් විය. මානව සම්පත් සහ තාක්ෂණය ප්‍රමාණවත් ලෙස වර්ධනය නොවීම, පරිපාලිත මිල ගණන් වෙළෙඳපොළ මිල ගණන් වලින් වෙනස්වීම, අතිරික්ත සේවා නියුක්තිය, ආයතනික පරිපාලනයේ පැවැති ගැටළු සහ අනවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම් බහුලව සිදුවීම නිසා නිෂ්පාදනය පහළ වැටීම, පෞද්ගලික අංශයේ කර්මාන්තවල සීග්‍ර ව්‍යාප්තිය සහ කර්මාන්තවල අයිතිය රාජ්‍ය අංශයේ සිට පෞද්ගලික අංශයට මාරුවීම හේතුවෙන් කර්මාන්ත අංශය තුළ රාජ්‍ය අංශයේ දායකත්වය 1980 ගණන් වල සිට අඛණ්ඩව පහත වැටුණි. පෞද්ගලික අංශය තුළ ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන කර්මාන්ත අංශයේ නිමැවුම 2002 දී අත්කර ගත් සියයට 1 ක වර්ධනය හා සසඳන කළ 2003 දී සියයට 3.9 කින් වර්ධනය වෙමින් යථාතත්ත්වයට පත්විය. 2002 දී අත්කරගත් සියයට 4.4 ක වර්ධනය හා සසඳන කළ ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත අංශයේ නිමැවුම 2003 දී සියයට 6.2 කින් වර්ධනය විය. 2003 දී කාර්මික අංශයේ වර්ධනය සඳහා ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත සියයට 58 කින් දායක වූ අතර ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත ඉතිරිය සඳහා දායක විය. 2003 කාර්මික නිමැවුමෙහි වර්ධනය සඳහා කාර්මික කාණ්ඩයන් නවයෙන් ප්‍රධාන වශයෙන් කාණ්ඩ තුනක් දායක විය. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදන, රසායන ද්‍රව්‍ය, රබර්, ඛනිජතෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන මෙම කාර්මික කාණ්ඩයන් විය. 2003 දී කර්මාන්ත අංශයේ වර්ධනය සඳහා මෙම කාර්මික කාණ්ඩ තුන සියයට 80 කින් දායක විය.

සාම වැඩ පිළිවෙල අඛණ්ඩව පැවැතීම හේතුවෙන් ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීම, ජාත්‍යන්තර ආධාර සපයන්නන්ගේ සහයෝගීත්වය, විදේශ විනිමය අනුපාතිකය ස්ථාවර වීම, ජාත්‍යන්තර වෙළෙඳපොළවල් වැඩිදියුණු වීම සහ හිතකර කාලගුණික තත්වයක් පැවැතීම හේතුවෙන් 2003 දී කාර්මික අංශය වාසි ලැබීය. උසස් කළමණාකරණ ශිල්ප ක්‍රමයන් භාවිතා කිරීම, ඵලදායිතාව ඉහළ නංවාගැනීමට ආයතනික මට්ටමින් පැවැති දැඩි කැපවීම සහ නවීන තාක්ෂණය සඳහා විශාල වශයෙන් ආයෝජනය කිරීම, 2003 දී කාර්මික අංශය තුළ හිතකර නිමවුම් වර්ධනයක් අත් කර ගැනීමට උපකාරී විය. ආයතනික අංශය තුළ මූල්‍ය ක්‍රියාකාරීත්වය ඉහළ යාම, තොග මට්ටම් පහළ යාම, ධාරිතා උපයෝජනය ප්‍රසාරණය වීම, සාර්ව ආර්ථික කළමනාකරණය ශක්තිමත් වීම සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමට රජයේ ඇති දැඩි කැපවීම හේතුවෙන් ව්‍යාපාරිකයින්ගේ සහ ආයෝජකයින්ගේ විශ්වාසනීයත්වය ඉහළ මට්ටමක පැවතිණි. වර්ෂයේ අවසාන භාගය තුළදී

**4.1 රූප සටහන**
**කාර්මික නිෂ්පාදන වර්ධනය සහ සංයුතිය**

**4.1.1 රූප සටහන**
**කාර්මික නිමැවුමෙහි වර්ධනය**




**4.1.2 රූප සටහන**
**කාර්මික නිමැවුමෙහි සංයුතිය - 2003**



ප්‍රාග්ධන සහ අන්තර් භාණ්ඩ ආනයන ඉහළ යාම තුළින් කර්මාන්ත අංශය තුළ ආයෝජන ඉහළ යෑමේ ප්‍රවනතාවයක් දැකිය හැකි විය. ජාත්‍යන්තර වෙළෙඳපොළවල් තුළ අවධමනාත්මක බලපෑමක් පැවතීම සහ අඩු පිරිවැය සහිත නිෂ්පාදිත රටවලින් එල්ල වූ දැඩි තරඟකාරීත්වය හමුවේ වුවද විශේෂයෙන්ම 2003 වර්ෂයේ දෙවන භාගයේ දී අපනයන මිල ගණන් ඉහළ ගියේය.

දේශීය වෙළෙඳපොළ මත පදනම් වූ කර්මාන්තයන්ගේ නිමැවුම 2003 වර්ෂයේ මුල් භාගය තුළදී මධ්‍යස්ථ වශයෙන් පමණක් වර්ධනය වුවද වර්ෂයේ දෙවන භාගයේදී පුළුල් පදනමක් තුළ ඉහළ වර්ධනීය තත්ත්වයක් අත්කර ගත්තේය. මෙම වර්ධනීය තත්ත්වය සියලු ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයන් තුළ දැකිය හැකි විය. කර්මාන්ත අංශය තුළ ඇති වූ මෙම ප්‍රබෝධයට පාරිභෝගික භාණ්ඩ සඳහා පැවැති ඉල්ලුම, ඉහළ යාම ප්‍රධාන වශයෙන් ඉවහල් විය. විශේෂයෙන්ම, සකස්කළ ආහාර, පාන වර්ග, මත්පැන්, බියර්, කිරිපිටි, සහ අනෙකුත් කිරි නිෂ්පාදිතයන්, සකස් කල මස්, බිස්කට්, සත්ව ආහාර සබන් සහ සනීපාරක්ෂක නිෂ්පාදන, රබර් ටයර් වැනි කර්මාන්තයන්හි ඉහළ ක්‍රියාකාරීත්වයක් දැකිය හැකි විය. ආර්ථික කටයුතු වල ඉහළ ක්‍රියාකාරීත්වය, ආරක්ෂක තත්ත්වය සුරක්ෂිත වීම සහ බෙදා හැරීමේ හැකියාව වර්ධනය වීම නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලින් ඇති වූ නව ඉල්ලුම, පහළ ගිය පොලී අනුපාතිකයන්, මධ්‍යස්ථ උද්ධමනය, ප්‍රමාද වූ ව්‍යාපෘතීන් නැවත ආරම්භ කිරීම, කොටස් වෙළෙඳපොළෙහි ඇති වූ ආකර්ෂනීය වර්ධනය සහ කෘෂිකාර්මික ප්‍රදේශයන්හි අස්වැන්න ඉහළයාම නිසා මෙම නිෂ්පාදනයන් සඳහා පැවැති ඉල්ලුම අඛණ්ඩව වර්ධනය විය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් 2003 දී අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වේගයකින් ප්‍රසාරණය විය. රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ සකස්කළ දියමන්ති වැනි අපනයනාභිමුඛ නිෂ්පාදන සාපේක්ෂව ඉහළ වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වුවද ජාත්‍යන්තර වෙළෙඳපොළවල පැවැති තියුණු තරඟකාරීත්වය නිසා ඇඟළුම්, රෙදිපිළි සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදනයන් ප්‍රමාණාත්මක වශයෙන් මධ්‍යස්ථ වර්ධනයක් පමණක් වාර්තා කරන ලදී. අඩු පිරිවැය නිෂ්පාදකයන් ජාත්‍යන්තර වෙළෙඳපොළවලට ප්‍රවිශ්ය වීම,

**4.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත අංශයේ නිෂ්පාදන වටිනාකම**

**(1990 ස්ථාවර මිල අනුව)**

| කාණ්ඩය | රුපියල් දශ ලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1999 | 2000 | 2001 | 2002 | 2003(අ) | 2002 | 2003(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 41,742 | 44,241 | 45,595 | 47,675 | 50,656 | 4.6 | 6.3 |
| ආහාර සහ වෙනත් | 26,330 | 28,094 | 29,146 | 30,428 | 32,649 | 4.4 | 7.3 |
| මත්පැන් | 3,327 | 3,397 | 3,478 | 3,659 | 4,098 | 5.2 | 12.0 |
| පාන වර්ග | 6,432 | 7,210 | 7,548 | 7,888 | 8,409 | 4.5 | 6.6 |
| දුම්කොළ නිෂ්පාදිත | 5,653 | 5,540 | 5,423 | 5,700 | 5,501 | 5.1 | -3.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 78,282 | 90,716 | 82,996 | 83,985 | 86,247 | 1.2 | 2.7 |
| ඇඟළුම් | 67,861 | 79,126 | 72,300 | 73,211 | 75,144 | 1.3 | 2.6 |
| රෙදිපිළි | 7,197 | 8,140 | 7,439 | 7,699 | 7,838 | 3.5 | 1.8 |
| සම් භාණ්ඩ | 3,224 | 3,450 | 3,257 | 3,075 | 3,265 | -5.6 | 5.9 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1,423 | 1,544 | 1,487 | 1,466 | 1,547 | -1.4 | 5.5 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 3,412 | 3,624 | 3,732 | 3,646 | 3,810 | -2.3 | 4.5 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 36,281 | 41,140 | 38,849 | 41,057 | 43,100 | 5.7 | 5.0 |
| රසායනික ද්‍රව්‍ය, තීන්ත වර්ග සහ පොහොර | 5,571 | 6,379 | 6,155 | 6,426 | 6,805 | 4.4 | 5.9 |
| රබර් | 6,082 | 6,824 | 6,104 | 6,519 | 7,940 | 6.8 | 21.8 |
| ප්ලාස්ටික් සහ පීවීසී | 4,292 | 4,571 | 5,051 | 5,258 | 5,705 | 4.1 | 8.5 |
| ඖෂධ, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අනෙකුත් | 10,336 | 10,956 | 10,532 | 10,911 | 11,555 | 3.6 | 5.9 |
| ඛනිජ තෙල් | 10,000 | 12,410 | 11,007 | 11,943 | 11,095 | 8.5 | -7.1 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 15,740 | 16,091 | 16,010 | 16,316 | 17,311 | 1.9 | 6.1 |
| දියමන්ති සැකසීම | 5,049 | 5,175 | 5,056 | 5,304 | 5,670 | 4.9 | 6.9 |
| පිඟන් නිෂ්පාදන | 2,029 | 2,053 | 1,808 | 1,877 | 1,943 | 3.8 | 3.5 |
| සිමෙන්ති | 4,785 | 4,823 | 4,943 | 4,869 | 5,254 | -1.5 | 7.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත් | 3,877 | 4,040 | 4,203 | 4,266 | 4,445 | 1.5 | 4.2 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,917 | 2,024 | 2,096 | 2,155 | 2,254 | 2.8 | 4.6 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 8,680 | 9,071 | 9,261 | 9,446 | 10,079 | 2.0 | 6.7 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4,375 | 4,559 | 4,627 | 4,720 | 5,046 | 2.0 | 6.9 |
| **එකතුව** | **191,852** | **213,010** | **204,653** | **210,466** | **220,050** | **2.8** | **4.6** |

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**4.2 සංඛ්‍යා සටහන**
**කාර්මික නිෂ්පාදන වටිනාකම** (අ)

| කාණ්ඩය | රුපියල් දශ ලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1999 | 2000 | 2001 | 2002 | 2003(ආ) | 2002 | 2003(ආ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 94,687 | 105,671 | 120,359 | 136,173 | 151,870 | 13.1 | 11.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 178,844 | 215,686 | 224,898 | 240,712 | 261,990 | 7.0 | 8.8 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 2,715 | 3,084 | 3,272 | 3,529 | 3,978 | 7.9 | 12.7 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 5,854 | 6,516 | 7,369 | 7,528 | 8,293 | 2.2 | 10.2 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 62,590 | 74,670 | 78,553 | 90,250 | 100,113 | 14.9 | 10.9 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 26,830 | 28,198 | 31,892 | 35,108 | 38,413 | 10.1 | 9.4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 3,046 | 3,378 | 3,888 | 4,323 | 4,690 | 11.2 | 8.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 14,305 | 15,678 | 17,638 | 19,358 | 21,872 | 9.8 | 13.0 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 9,002 | 9,839 | 10,361 | 11,450 | 12,980 | 10.5 | 13.4 |
| **එකතුව** | **397,873** | **462,720** | **498,230** | **548,431** | **604,199** | **10.1** | **10.2** |

(අ) නිෂ්පාදන වාර්ෂිකව මිහලින් පිටවන විට පැවති වටිනාකම පදනම් කරගෙන ඇස්තමේන්තු කර ඇත.
(ආ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

වරණීය වෙළෙඳ ගිවිසුම් යටතේ සිදුකරන වෙළෙඳාම වර්ධනය වීමේ ප්‍රවණතාවය සහ සමහර අප්‍රිකානු සහ කැරිබියානු රටවල් සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය විසින් සපයා දී ඇති විශේෂ සහන හේතුවෙන් ජාත්‍යන්තර තරඟකාරීත්වය අඛණ්ඩව වර්ධනය විය. උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (North American Free Trade Agreement), කැරිබියානු ප්‍රදේශයේ මුල් පිරීම (Caribbean Basin Initialers) සහ අප්‍රිකානු වර්ධන සහ අවස්ථාවන් පිළිබඳ පනත (African Growth and opportunities Act) වැනි වරණාත්මක වෙළෙඳ ගිවිසුම් හේතුවෙන් ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා අමෙරිකානු වෙළෙඳපොළ තුළ පැවැති අලෙවි අවස්ථාවන් පහත වැටී ඇත. අති විශාල නිෂ්පාදන ධාරිතාවය, ශක්තිමත් රෙදිපිළි පදනම, තාක්ෂණයේ අඛණ්ඩ වර්ධනය, අඩු උපයෝගීතා පිරිවැය සහ ඉහළ ශ්‍රම ඵලදායිතාව හේතුකොට ගෙන ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ චීනයේ නිෂ්පාදිත සඳහා පවතින තරඟකාරීත්වය තියුණු විය. භූගෝලීය වශයෙන් යුරෝපීය සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවලට ආසන්නව පිහිටීම හේතුවෙන් නැගෙනහිර යුරෝපීය සහ දකුණු ඇමෙරිකානු රටවල් භාණ්ඩ බෙදාහැරීමට ගතවන කාලය අනුව තරඟකාරී විය.

වෙනස් වෙමින් පවතින ව්‍යාපාරික වාතාවරණයන්ට මුහුණදීම සඳහා 1990 මැද භාගයේ සිට කර්මාන්ත අංශය මූලික ප්‍රතිව්‍යුහගත වීමේ ක්‍රියාවලියකට ලක් වෙමින් පවතී. මෙම ප්‍රතිව්‍යුහගතවීමේ ක්‍රියාවලිය, කර්මාන්ත ඒකාබද්ධ කිරීම සහ අත්පත් කර ගැනීම, අයිතිය වෙනස් කිරීම, කර්මාන්ත නැවත ස්ථානගත කිරීම, ලාභදායි නොවන නිෂ්පාදන ඒකක වසා දැමීම, තාක්ෂණය වෙනස් කිරීම සහ පිරිවැය අඩු කිරීම ආදී වශයෙන්, 2003 දී ද අඛණ්ඩව සිදුවිය. වෙළෙඳපොළ ප්‍රවනතාවයන්, පාරිභෝගික උපයෝගීතාවයන් සහ තාක්ෂණය වෙනස්වීම හමුවේ තරඟකාරීත්වය තියුණු කර ගැනීමට, කාර්යක්ෂමතාවය වැඩිදියුණු කර ගැනීමට සහ ලාභදායිත්වය ඉහළ නංවා ගැනීමට පියවර ගන්නා ලදී. ඇනවුම් ඉදිරිපත් කිරීම, අලෙවිකරණය, සැපයුම් ක්‍රියාදාම කළමණාකරණය සහ උපාය මාර්ගික තීරණ ගැනීම යන අංශයන් සඳහා තොරතුරු තාක්ෂණය බහුල වශයෙන් උපයෝගී කර ගැනීම අඛණ්ඩව සිදුවිය. සේවකයන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් ඉටු කිරීම සහ පිරිවැය අඩු කිරීම, සේවක ප්‍රමාණය අඩුකිරීම හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම වැනි ව්‍යාපාරික උපාය මාර්ගයන් ක්‍රියාවට නැංවීම අතර ප්‍රශස්ථ සමබරතාවයක් පවත්වා ගැනීමට උත්සාහ ගනු ලැබීය. නිෂ්පාදනවල ඉහළ ගුණාත්මක තත්ත්වය, නියමිත දිනයේදී භාණ්ඩ සැපයීම, තරඟකාරී මිල ගණන් සහ ශ්‍රමය සම්බන්ධයෙන් නිෂ්පාදකයින් විසින් පවත්වා ගන්නා ලද ඉහළ ප්‍රමිතීන් හේතුවෙන් ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර ගැණුම්කරුවන් අතර ශක්තිමත් සුභවාදී ප්‍රතිරූපයක් නිර්මාණය කර ගැනීමට හැකි විය.

ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පෞද්ගලික අංශය විසින් ගන්නා ලද උත්සාහය සඳහා තරඟකාරීත්වය ඉහළ නැංවීම සම්බන්ධයෙන් රජය විසින් ගනු ලැබූ පියවරවල් තවදුරටත් උපකාරී විය. ශ්‍රම වෙළෙඳපොළෙහි නම්‍යශීලීත්වය ඉහළ නැංවීම සඳහා 2003 දී රජය විසින් පවතින කම්කරු නීති රැසක් සංශෝධනය කරන ලදී. උද්ධමනාත්මක බලපෑමකින් තොරව සේවක වැටුප් ඉහළ නැංවීම, ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීම, ශ්‍රම සංචලතාව ඉහළ නැංවීම සහ ශ්‍රම වෙළෙඳපොළෙහි නම්‍යශීලිත්වය වැඩි කිරීම අරමුණු කොට ගෙන රජය විසින් ඉදිරියේදී සේවක සහ කාර්මික සබඳතා පනත හඳුන්වාදීමට සැලසුම් කර ඇත. 2003 වර්ෂයේ දී විදුලි සංදේශ අංශය තුළ ජාත්‍යන්තර ප්‍රවේශයන් ලිහිල් කරනු ලැබූ අතර එය ජාත්‍යන්තර දුරකතන ඇමතුම් ගාස්තුවල පිරිවැය අඩුවීමට සහ අනාගතයේදී වර්ධනය වීමට ඉහළ ශක්‍යතාවයක් ඇති ක්ෂේත්‍රයක් වශයෙන් සැළකෙන තොරතුරු සහ සංනිවේදන කටයුතු බහුලව ප්‍රයෝජනයට ගැනීම සඳහා මහඟු අවස්ථාවන් නිර්මාණය කර දී ඇත. රේගු සහ බදු රැස්කිරීම වැනි ක්ෂේත්‍රයන්හි ඇති වූ

ප්‍රතිසංස්කරණයන් ව්‍යාපාරික ගනුදෙනු පිරිවැය අඩුවීමට හේතු විය. ස්ථිර තීරුබදු කොමිසමක් ස්ථාපිත කිරීම තීරුබදු ව්‍යුහයේ විෂමතාවයන් ඉවත් කිරීමට උපකාරී විය. 2003 අයවැය මගින් ප්‍රකාශයට පත් කළ විදේශ විනිමය ලිහිල් කිරීම තුළින්, ආයෝජන මණ්ඩල පණතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ ව්‍යවසායකයන්ට රුපියල් ණය පහසුකම් සීමාවකින් තොරව ලබා ගැනීමට අවසර ලබා දුනි.

මහා මාර්ග සහ බලශක්ති යන ක්ෂේත්‍රයන්හි යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, විදුලි සැපයුම නිතර ඇණහිටීම සහ වෝල්ටීයතාවය උච්ඡාවචනය වීම, නීතිය හා නීතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් පවතින ගැටළු, බුන්වත්භාවය පිළිබඳ විධිමත් නීති සංග්‍රහයක් නොපැවතීම සහ ඒ හා සම්බන්ධ අධිකරණමය ක්‍රියාමාර්ග නොමැතිවීම කර්මාන්ත අංශයේ වේගවත් වර්ධනයට එරෙහිව තවදුරටත් පවතින ප්‍රධාන බාධකයන් වේ. ආර්ථිකයේ සමහර කටයුතු සම්බන්ධයෙන් විශාල කාලයක් ගතවන වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් සහ බාධාකාරී අනුමත කිරීමේ ක්‍රියාවලීන් වැනි රෙගුලාසීන් පැවතීම නිසා ව්‍යාපාරික ගනුදෙනු පිරිවැය ඉහළ ගොස් ඇත. ජාත්‍යන්තර වෙළෙඳපොළවල පවතින ඉහළ තරඟකාරීත්වය සහ ක්ෂණික කම්පන, අපනයන වෙළෙඳපළ විවිධාංගීකරණය කිරීමේ සහ නිෂ්පාදන පදනම පුළුල් කිරීමේ උපාය මාර්ගවල අවශ්‍යතාවය පෙන්වා දෙනු ලැබීය. ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන්, විශේෂයෙන්ම වෙළෙඳ එකඟතාවයන් වලට පැමිණීම, වෙළෙඳපොළ අවස්ථාවන් සම්බන්ධ තොරතුරු සපයයාදීම, ව්‍යාපාරික වාතාවරණය වැඩි දියුණු කිරීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම, නිපුණතා සංවර්ධනය, ආයතනික කළමනාකරණය ඉහළ නැංවීම සහ ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පෞද්ගලික අංශයට පහසුකම් සැපයිය යුතුය. එසේම අධික බලශක්ති පිරිවැය සහ බලශක්ති ක්ෂේත්‍රයේ ධාරිතාවය ප්‍රමාණවත් ලෙස ව්‍යාප්ත නොවීම හේතුවෙන් අනාගත පෞද්ගලික ආයෝජනයන් අධෛර්යමත් විය හැකි බැවින් බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණයන් කෙරෙහි අවධානයක් දැක්විය යුතුය. එසේම සුළු කර්මාන්තයන්හි තාක්ෂණය වැඩි දියුණු කිරීම, කළමණාකරණ හැකියාවන් උසස් කිරීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ අත්පත් කර ගැනීම සඳහා සහාය වීමට නව ක්‍රියාමාර්ග හඳුන්වාදීම අවශ්‍ය වේ.

## 4.2 කාර්මික ප්‍රතිපත්තිය සහ ආයතනික පහසුකම්

කාර්මික අංශයේ දිගු කාලීන වර්ධනය මූලික වශයෙන් නව සොයාගැනීම් සහ ඵලදායිතා වර්ධනය මත රඳා පවතී. එබැවින් 1977 සිට පෞද්ගලික අංශය ප්‍රමුඛ කරගත් අපනයාභිමුඛ කාර්මීකරණය සමස්ථ කාර්මික ප්‍රතිපත්තියෙහි ප්‍රමුඛත්වය හිමිකරගත් අතර රජය අනුපූරක පොදු භාණ්ඩ සපයාදීම සහ පහසුකම් සපයන්නකු ලෙස කටයුතු කළේය. වෙනස්වන ජාත්‍යන්තර වෙළෙඳපොළ පරිසරයක් තුළ තීරුබදු සහ යහනාධාර මගින් ආරක්ෂණයක් නොලබා තරඟකාරී ලෙස කටයුතු කළ හැකි කර්මාන්ත අංශයක් බිහිකිරීම කෙරෙහි දිගුකාලීන කාර්මික ප්‍රතිපත්තිය වැඩි අවධානයක් යොමු කරනු ලැබීය. මෙම අරමුණ ශාක්ෂාත් කර ගැනීම සඳහා කාර්මික අංශය සංවර්ධනය කිරීම පිළිබඳ රජයේ කාර්යභාරය රෙගුලාසි ක්‍රියාත්මක කරන්නකුගේ සිට පහසුකම් සපයන්නෙකු ලෙස වෙනස් විය. ඒ අනුව ව්‍යාපාරික කටයුතු සඳහා පවතින බාධාවන් සහ අනවශ්‍ය පාලනය කිරීම් ඉවත් කිරීම, ව්‍යාපාරික වාතාවරණය වැඩි දියුණු කිරීම, වෙළෙඳාම සඳහා පහසුකම් සැපයීම, තරඟකාරීත්වය වර්ධනය කිරීම, ආයතනික පරිපාලනය වැඩි දියුණු කිරීම, විදේශ ආයෝජන ප්‍රවාහයන් සඳහා පවතින බාධාවන් ඉවත් කිරීම සහ විදේශීය තාක්ෂණය සහ විදේශ ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා පහසුකම් සපයාදීම කෙරෙහි රජයේ කාර්මික ප්‍රතිපත්තියේ අවධානය යොමු විය.

නුපුහුණු සහ අර්ධ පුහුණු ශ්‍රම අවස්ථාවන් සපයාදීම සම්බන්ධව කාර්මික අංශයේ කැපී පෙනෙන දායකත්වය සැලකිල්ලට ගනිමින් රජය තම මධ්‍යකාලීන සාර්ව ආර්ථික වැඩපිළිවල මගින් දිළිඳුකම අඩු කිරීම කාර්මික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ විය යුතු යැයි යෝජනා කරන ලදී. රජයේ දිළිඳුකම අඩුකිරීමේ උපාය මාර්ග ශාක්ෂාත් කර ගැනීම සඳහා කාර්මික අංශය ප්‍රාදේශීය වශයෙන් වැඩි රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ජනනය කළ යුතුවේ. ආදායම් උත්පාදනය, දිළිඳුකම පිටු දැකීම, ප්‍රාදේශීය සංවර්ධනය සහ අඩු ආයෝජන පිරිවැයකින් වැඩි රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ජනිත කිරීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ඇති හැකියාව සලකා බලමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම කෙරෙහි ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. සුළු හා මධ්‍ය පරිමාණ කාර්මික අංශයෙහි ඉදිරි දැක්ම සහ එය ලඟා කර ගැනීමේ උපාය මාර්ග, එම අංශයේ වර්ධනය සඳහා බලපාන ආයතනික රාමුව, දිරිගැන්වීම් සහ පහසුකම් ඇතුලත් සුළු හා මධ්‍ය පරිමාණ කාර්මික අංශය ප්‍රවර්ධනය කිරීමේ ධවල පත්‍රිකාවක් 2003 වර්ෂයේ දී ඒහා සම්බන්ධ ප්‍රධාන අමාත්‍යාංශ වලට ඉදිරිපත් කරන ලදී.

කාර්මික ප්‍රතිපත්තියෙහි බහුවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ සාර්ව ආර්ථික කළමණාකරණය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. විදේශ ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය දිරිගැන්වීම් සහ සහන රැසක් ලබා දුන්නද, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, රෙගුලාසි නිසා ඇතිවන අනවශ්‍ය බර සහ සිවිල් ගැටුම් නිසා බලාපොරොත්තු වූ ලෙස ඉහළ ආයෝජන ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට නොහැකි විය. තාක්ෂණයේ සිදුවන සීඝ්‍ර වෙනස්වීම, ගෝලීයකරණය සහ ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් තරඟකාරීත්වය ඉහළයාම නිසා ව්‍යාපාරික පරිසරය වෙනස් වෙමින් පවතී. එබැවින් සීඝ්‍රයෙන් වෙනස්වන මෙම වෙළෙඳ පරිසරය තුළ ව්‍යවසායකයන් නව සොයා ගැනීම් සඳහා පොළඹවන, නම්‍යශීලි සහ තරඟකාරී වෙළෙඳ පරිසරයක් සපයා දීම තුළින් තාක්ෂණය වර්ධනය කිරීම, භාණ්ඩ වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, වෙළෙඳපොළ පුළුල් කිරීම සහ කර්මාන්ත

අංශයේ තරඟකාරීත්වය ඉහළ නැංවීමට හැකිවන පරිසරයක් නිර්මාණය කිරීම කාර්මික ප්‍රතිපත්තියේ අරමුණ විය යුතුය.

දැනට රටතුළ ක්‍රියාත්මක වන සමහර රෙගුලාසීන් ව්‍යාපාරික ගනුදෙනු පිරිවැය අහිතකර ලෙස ඉහළ යාමට, ව්‍යාපාරික තීරණ ගැනීමේ කඩිනම් බව අඩු කිරීමට සහ දේශපාලනික බලපෑම් හා අනුග්‍රහයන් සඳහා ඉඩ සලසා දීමට හේතු වී ඇත. මෙම අනවශ්‍ය සහ සංකීර්ණ රෙගුලාසීන්, දූෂණය, ප්‍රමාදවීම්, සම්පත් අපතේ යෑම්, අකාර්යක්ෂමතාවයන් සහ රජයට ලැබෙන ආදායම් අහිමිවීම් වැනි අක්‍රමිකතාවයන් සඳහා පාලකයින් උනන්දු කරවනු ලැබීය. මෙම ගැටළුව විසඳීම සඳහා රජය විසින් 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ පනත යටතේ රෙගුලාසි ලිහිල් කිරීමේ කමිටුව 2001 දී ස්ථාපනය කරන ලදී. මෙම කමිටුව විසින් දේශීය නිෂ්පාදනවල තරඟකාරීත්වය සහ ව්‍යාපාරික කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපාන බාධාවන් ඉවත් කිරීම සඳහා යෝජනාවන් රැසක් රජයට ඉදිරිපත් කර ඇත. මෙම නිර්දේශයන්ගේ වැදගත්කම සලකා රේගු සහ තීරු බදු, බදු පරිපාලනය, කම්කරු නීති සහ ඉඩම් හා ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් පවත්නා රෙගුලාසි සරල කිරීමට සහ දැනට පවත්නා ක්‍රියාවලීන් ඒකාබද්ධ කිරීම වැනි ප්‍රධාන ක්ෂේත්‍රයන්හි රෙගුලාසි ලිහිල් කිරීමට රජය තීරණය කර ඇත. රෙගුලාසි ලිහිල් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කළයුතු වැඩ පිළිවෙළක් වන බැවින් රෙගුලාසි ලිහිල් කළ යුතු අනෙකුත් ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමට සහ මුලින් ඉදිරිපත් කළ යෝජනාවන් ක්‍රියාත්මක වන ආකාරය සොයා බැලීමට රජය විසින් මෙම කමිටුව නැවත පත් කළේය. ණයකරුවන්ගේ අයිතිවාසිකම් රැකෙන පරිදි සහ අසාර්ථක වූ ආයතන වලට ක්‍රමානුකූල ලෙස ව්‍යාපාරික කටයුතු වලින් ඉවත්වීමට පහසුකම් සැලසෙන පරිදි රජය විසින් බුන්වත් භාවය පිළිබඳ නීති සංග්‍රහයක් ඉදිරිපත් කිරීමට යෝජනා කර ඇත.

ශ්‍රම වෙළෙඳපොලේ පවතින දැඩි බව සහ අසමතුලිතතාවය ආයෝජන ප්‍රවාහයන් රට තුළට පැමිණීම, නව රැකියා අවස්ථාවන් ජනනය වීම සහ කාර්මික අංශයේ වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපාන බව හඳුනාගෙන ඇත. මෙම ගැටළු අවම කිරීම සඳහා රජය විසින් ශ්‍රම වෙළෙඳපොළෙහි නම්‍යශීලී බව වැඩි කිරීම සහ අසමතුලිතතාවයන් අවම කිරීම සඳහා පියවර ගණනාවක් ගෙන ඇත. කලින් වසරකට ස්ත්‍රියක් සඳහා අතිකාල සේවයේ යෙදීමට අවසර දී තිබූ පැය 100 ක ප්‍රමාණය මසකට පැය 60 දක්වා (වසරකට පැය 720) වැඩි කිරීම සඳහා 1942 අංක 68 දරණ කම්හල් ආඥා පනත සංශෝධනය කරන ලදී. ශ්‍රම වෙළෙඳපොළෙහි පවතින අනම්‍යශීලී බව අඩු කිරීම සඳහා වර්ෂය තුළදී කම්කරුවන් සේවයෙන් ඉවත් කිරීමේ පනත (විශේෂ ආඥා පනත) සහ කම්කරු ආරවුල් පනත සංශෝධනය කර ඇත. ශ්‍රම වෙළෙඳපොළෙහි ඉහළ නම්‍යශීලිතාවයක් පැවැතීම දැනට සිටින සේවා නියුක්තියන්ගේ රැකියා සුරක්ෂිතතාවය ආරක්ෂාවීම සඳහා පමණක් නොව අනාගතයේ විශාල රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ජනනය කිරීම සඳහා ද අත්‍යාවශ්‍ය වේ. වර්ධනය වන ඕනෑම ආර්ථිකයක්, තම අනාගත පරපුරට අවශ්‍ය රැකියා ජනනය කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු අතර සේවායෝජකයින්ට පහසුවෙන් සේවකයින් ලබාගැනීමට හැකිවන පරිසරයක් ගොඩනැංවිය යුතුය. බාධාකාරී කම්කරු නීති පැවැතීම නිසා අපහසුකාරී අවස්ථාවලට මුහුණ දීමට අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ සිදු කිරීමට නොහැකි වන අතර එමගින් දැනට සිටින සේවානියුක්තිකයන්ගේ රැකියා අවස්ථාවන් පවා අහිමිවීමේ අවධානමක් ඇති කරනු ලබයි. මෙම සංශෝධනයන් 2003 දෙසැම්බර් මස 31 දින සිට ක්‍රියාත්මක වේ. සේවකයින් සේවයෙන් ඉවත් කිරීමේදී ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ගණනය කිරීමට අදාල සමීකරණයක් 2003 දෙසැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කොට ඇත. මෙම සංශෝධන මගින් ශ්‍රම වෙළෙඳපොළ නම්‍යශීලීත්වය ඉහළ යනු ඇතැයි බලාපොරොත්තු වන අතර එමගින් ව්‍යාපාරික සහ ආර්ථික වාතාවරණයට ගැලපෙන ආකාරයට තම ශ්‍රමිකයින් සුදුසු පරිදි හැඩගස්සවා ගැනීමට සේවා යෝජකයන්ට අවස්ථාව සැලසෙනු ඇත.

ප්‍රතිපත්ති සම්පාදනයේදී පෞද්ගලික අංශය සමඟ ක්‍රියාකාරී සංවාදයක් ඇති කිරීම සඳහා රජය පෞද්ගලික අංශයේද සහභාගීත්වය ඇතිව විශේෂ කාර්ය සාධක බලකායන් රැසක් පිහිටුවා ඇත. රබර්, මැණික් හා ස්වර්ණාභරණ, කොහු නිෂ්පාදන, ප්ලාස්ටික්, පිඟන්, කුළුබඩු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනයන්, දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදනයන්, සම් සහ සම් නිෂ්පාදිත, ඇසුරුම්, තේ සහ සැකසූ ආහාර යන අංශයන් සම්බන්ධයෙන් මෙම කාර්ය සාධක බලකායන් ස්ථාපිත කර ඇත. එක් එක් කාර්ය සාධක බලකායන් වලට තම අංශයට අදාල පස් අවුරුදු සැලසුමක් සකස් කිරීම පිළිබඳ වගකීම පවරා ඇත. මෙම කාර්ය සාධක බලකායන් විසින් දැනටමත් පස් අවුරුදු සැලසුම් සම්පූර්ණ කර ඇති අතර ව්‍යවසාය සංවර්ධන, කර්මාන්ත ප්‍රතිපත්ති සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යංශය විසින් මෙම සැලසුම්වල නිර්දේශයන් ක්‍රියාවට නැංවීම ආරම්භ කර ඇත.

රාජ්‍ය මූල්‍ය සංරෝදකවලට මුහුණ දීමට සිදුවීම නිසා රජයට එකිනෙකට වෙනස් සහනාධාරයන් සැපයීම තුලින් ඇති වූ අහිතකර තත්ත්වයන් ඉවත් කිරීමේ සහ සියලුම ආයෝජකයින් සඳහා සමාන ව්‍යාපාරික පරිසරයක් පිළියෙල කර දීමේ අවශ්‍යතාවය මතු විය. එබැවින් දැනට පවතින සහනාධාර වැඩ පිළිවෙල තාර්කීයකරණය කිරීමට රජය තීරණය කොට ඇත. මේ සම්බන්ධයෙන් 2004 අප්‍රේල් සිට බලපැවැත්වෙන පරිදි දේශීය ආදායම් පනත යටතේ ලබා දී ඇති බදු විරාමයන් තාර්කීයකරණය කිරීමට 2004 අයවැය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ශක්තිමත් සාර්ව ආර්ථික වාතාවරණය මගින් ජනිත කළ චක්‍රාකාර දිරිගැන්වීම් මගින් 2003 දී කාර්මික අංශය වාසි ලැබීය. පොලී සහ උද්ධමන අනුපාතිකයන් පහළ මට්ටමක පැවතීම, විනිමය අනුපාතිකයන් ස්ථාවර මට්ටමක පැවතීම සහ අයවැය මූල්‍යකරණය සඳහා රාජ්‍ය ණය ලබා ගැනීම පහත වැටීමේ

**විශේෂ සටහන 10**

## කර්මාන්ත අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය

යෙදවුම් සහ නිමවුම් අතර අනුපාතයක් වශයෙන් ඵලදායිතාවය මනිනු ලැබේ. ඵලදායිතාව මගින් නිෂ්පාදන ක්‍රියාදාමයේ කාර්යක්ෂමතාවය සහ යෙදවුම් කෙතරම් ඵලදායි ලෙස නිමවුම් බවට පරිවර්තනය කරන්නේ ද යන්න පෙන්නුම් කරනු ලබයි. වඩා පුළුල් වශයෙන් සලකා බලන කළ භෞතික සහ මානව සම්පත් ඉතා කාර්යක්ෂම අයුරින් යොදාගෙන නිමවුම් ජනිත කිරීමට ආර්ථිකයට ඇති හැකියාව ඵලදායිතා මිනුම් මගින් පිළිබිඹු කරනු ලබයි. තරඟකාරිත්වය පවත්වා ගැනීමට අවශ්‍යවන බැවින් ශ්‍රී ලංකාවෙහි කර්මාන්ත අංශයේ අනාගතය, ඵලදායිතා වර්ධනය මත තීරණාත්මක ලෙස රඳා පවතිනු ඇත.

ඵලදායිතාව තිරසාර ආර්ථික වර්ධනයක් සමග ඉතා සමීපලෙස සම්බන්ධව පවතී. එය නිෂ්පාදන සාධක කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීම උනන්දු කරනු ලබයි. නිෂ්පාදන සාධක ඒකරාශී වීම තුළින් ලබාගත හැකි සංවර්ධනය සම්පූර්ණයෙන්ම අත්කරගත් පසුව දිගුකාලීන ආර්ථික සංවර්ධනය සාධක ඵලදායිතාවයේ ප්‍රතිඵලයක් බවට පත්වේ.

ඵලදායිතා වර්ධනය තාක්ෂණික වැඩිදියුණු වීම, පර්යේෂණ සහ සංවර්ධනය, යහපත් කළමණාකාරීත්වය සහ මානව හා භෞතික ප්‍රාග්ධනය උපයෝජනය සඳහා යොදා ගන්නා ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වේ. ඵලදායිතාවය වැඩි දියුණු කිරීම, ආයතනික උපාය මාර්ග තුළ ප්‍රමුඛ ස්ථානයක් ගත යුතු අතර රජය ප්‍රමාණවත් යටිතල පහසුකම් ලබාදීම, දේපල අයිතිය සහතික කිරීම රාජ්‍ය පාලනයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම, සමාජ සුරක්ෂිතභාවය සහ අනෙකුත් පොදු භාණ්ඩ සපයා දීම තුළින් සාර්ව ආර්ථික කාර්යක්ෂමතාවය වැඩිදියුණු කළ යුතුය.

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තරඟකාරිත්වය තියුණු වෙමින් පවතී. දේශීය නිෂ්පාදනවලට ආනයන සමග සාර්ථක ලෙස තරඟ කිරීමට හැකියාවක් තිබිය යුතු අතර අපනයනවලට ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ සාර්ථක ලෙස තරඟ කිරීමට හැකියාවක් තිබිය යුතුය. වෙළෙඳපොළ සම්බන්ධයෙන් පැවැති සීමාවන් සීග්‍රයෙන් අඩුවෙමින් පවතින අතර සමහර අවස්ථාවලදී එවැනි සීමාවන් දැකිය නොහැකි වේ. ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළදී ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයන්ට ඉහළ පිරිවැය කාර්යක්ෂමතාවයකින් යුතු චීනය, ඉන්දියාව සහ අනිකුත් ආසියාතික ආර්ථිකයන් හි තරඟකාරී ආයතන සමඟ තරඟ කිරීමට සිදුවේ. මෙම ව්‍යාවසායන් සමග තරඟකිරීම සඳහා අඛණ්ඩව ඵලදායිතාව වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන බහුතරයක් පසුගිය වකවානුවේදී අඩු වැටුප් පදනම් කර ගනිමින් මිල මත පමණක් තරඟ කරනු ලැබීය. එහෙත් දීර්ඝ කාලීනව, වැටුප් පහළ මට්ටමක නොපවතින අතර එසේ පවත්වා ගැනීමට ද අවශ්‍ය නොවේ. එබැවින් වැටුප් ඉහළයාම පිළිබඳ ගැටළුව විසඳා ගැනීමට හැකි වන්නේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම තුළිනි.

ආයතනවල විශේෂිත ගැටළු සහ සාර්ව ආර්ථික වාතාවරණයෙහි පවත්නා අකාර්යක්ෂමතාවන් හේතු කොටගෙන ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ ශ්‍රම ඵලදායිතාව පසුගිය කාලය තුළදී ක්‍රමානුකූල ලෙස වර්ධනය නොවීය. කෙසේ වුවද 1996 සිට රජය ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා ඉතා වැදගත් උපාය මාර්ග රැසක් ගෙන ඇත. මෙම උපාය මාර්ගවල මූලික අභිප්‍රාය වූයේ ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ තුළින් වඩා හිතකර වාතාවරණයන් සලසා දීම හරහා තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම සහ අපනයනාභිමුඛ ව්‍යවසායකයන් බිහිකිරීමත් එමගින් ජාත්‍යන්තර වෙළෙඳපොළ කරා ළඟා වීමත්ය. ආර්ථිකයෙහි වැදගත් අංශ රාශියක දැනට පවත්නා රෙගුලාසි ලිහිල් කිරීම, වෙළෙඳාම සහ සෘජු විදේශ ආයෝජන සඳහා පවතින බාධාවන් සැලකිය යුතු ලෙස අඩු කිරීම, රජයේ අතිශය වැදගත් කටයුතුවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, ස්ථාවර ආර්ථික වාතාවරණයක් පවත්වා ගැනීම, රාජ්‍ය ව්‍යවසායයන් වාණිජකරණය හෝ පුද්ගලීකරණය කිරීම, දේශීය තරඟකාරීත්වය ශක්තිමත් කිරීම, ශ්‍රී ලංකා රුපියල පාවීමට ඉඩකඩ සැලසීම සහ ශ්‍රම වෙළෙඳපොළෙහි නම්‍යශීලිබව වර්ධනය කිරීම මෙම ප්‍රතිසංස්කරණ වලට අයත් වේ. මෙම ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ හේතුවෙන් වෙළෙඳාම, ආයෝජනය හා විදේශයන්හි දියුණු කරන ලද තාක්ෂණය හා දැනුම සඳහා ආර්ථිකය විවෘත වූ අතර, ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ඇති වූ තරඟකාරීත්වය ශක්තිමත් කිරීම තුළින් භාණ්ඩ හා නිෂ්පාදන සාධක වෙළෙඳපොළෙහි ඉහළ නම්‍යශීලීත්වයක් ඇතිකරන ලදී. තොරතුරු තාක්ෂණය බහුල වශයෙන් යොදා ගැනීම, නිමැවුම් තවදුරටත් සංවර්ධනය කිරීම, සැපයුම් ක්‍රියාදාම කළමනාකරණය වැඩිදියුණු කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ ඉහළ කළමනාකරණ ශිල්ප ක්‍රම භාවිතය මගින් ව්‍යවසායකයින් මෙම වැඩපිළිවෙළ සඳහා ප්‍රතිචාර දැක්වීය.

තොරතුරු තාක්ෂණයෙහි කර ඇති ඉහළ ආයෝජනය මෑත කාලයේ දී ඵලදායිත්වය වර්ධනය වීමට බලපෑ ප්‍රධාන සාධකයක් ලෙස සලකනු ලැබේ. පසුගිය දශකය තුළ තොරතුරු තාක්ෂණය බහුල වශයෙන් යොදා ගැනීම නිසා

නිමැවුම්වල ගුණාත්මක තත්ත්වයේ ඒකමතිකභාවය රැක ගැනීමට හැකි වූ අතර එය අලෙවිකරණය, සැපයුම් ක්‍රියාදාම කළමණාකරණය සහ උපායමාර්ගික තීරණ ගැනීම තුළින් ඉහළ කාර්යක්ෂමතාවයක් ළඟාකර ගැනීමට උපකාරී වී ඇත. ව්‍යවසායකයන් තම කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇති අතර මානව සම්පත්වල උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා උපාය මාර්ගයන් දියුණු කර ඇත. ඉහළ නිපුණතාවයන් ඵලදායිතාවය වර්ධනය වීම කෙරෙහි දෙආකාරයකින් බලපානු ලබයි. ප්‍රථමයෙන් නිපුණතාවයන් සේවකයන්ගේ මිනිස් පැයක නිමැවුම වර්ධනය වීම කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරනු ලබයි. දෙවනුව උගත් සහ නිපුණතාවලින් හෙබි සේවකයන්ට තම දැනුම වර්ධනය කර ගැනීමට සහ තාක්ෂණය තවදුරටත් වැඩිදියුණු කිරීමට හැකියාව ඇත. පසුගිය වකවානුවේදී තොරතුරු තාක්ෂණය පිළිබඳ විශාල දැනුමක් ඇතිවීම මෙයට උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

නවීන කලමණාකරණ ශිල්පක්‍රම භාවිතා කිරීම තුළින් මානව ප්‍රාග්ධන උපයෝජනය වැඩිදියුණු කිරීම සඳහා නව උපාය මාර්ග අඛණ්ඩව හඳුන්වා දීමේ අවශ්‍යතාවයක් පවතින අතර පර්යේෂණ සහ සංවර්ධනය තුළින් නව සොයා ගැනීම් සඳහා උනන්දු කළ යුතුය. දේශීය වෙළෙඳපොළ ප්‍රමාණවත් නොවීම නිසා භාණ්ඩ විශේෂීකරණයට සහ සංවර්ධනයට අවස්ථාවන් නොලැබෙන බැවින් ඔවුන්ට විදේශ වෙළෙඳපොළ තුළ තරඟ කිරීමට නිරතුරුව සිදුවනු ඇත.

ආර්ථික ස්ථායිතාවය පවත්වාගෙන යාම, අස්ථාවර භාවයන් අවම කිරීම සහ දේපල අයිතිය පිළිබඳ සුරක්ෂිතභාවය ඇති කිරීම සඳහා වඩා හිතකර වාතාවරණයක් ඇති කිරීමට රජය කටයුතු කළ යුතුය. එසේම රජය පෞද්ගලික අංශයේ ඵලදායිතාවය වැඩි කිරීමට අවශ්‍ය භෞතික, ක්‍රියාපටිපාටීන් සහ නීතිමය යටිතල පහසුකම් සහ අනුපූරක පොදු භාණ්ඩ සපයා දිය යුතුය.

**සංඛ්‍යා සටහන 1**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදායිතාව වෙනස්වීම**

ප්‍රතිශත වෙනස

| කාර්මික කාණ්ඩය | 1999 | 2000 | 2001 | 2002 | 2003 |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 2.8 | 4.0 | -2.6 | 3.2 | 3.5 |
| 2 රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 1.1 | 3.1 | -7.1 | -0.8 | 2.2 |
| 3 දැව හා දැව නිෂ්පාදිත | 0.1 | 0.3 | -3.4 | -2.0 | 1.9 |
| 4 කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 1.0 | 1.2 | -0.4 | -2.5 | -0.5 |
| 5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 0.4 | 6.7 | 2.2 | 2.2 | 3.3 |
| 6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 2.9 | 1.0 | 1.5 | 1.5 | 2.1 |
| 7 මූලික ලෝහ නිෂ්පාදිත | -3.5 | 1.3 | -0.7 | -1.5 | 1.3 |
| 8 සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 4.3 | 4.4 | -3.4 | 1.0 | 2.0 |
| 9 අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | -4.0 | 1.0 | 0.6 | 1.5 | 1.9 |
| **එකතුව** | **1.9** | **3.6** | **-2.5** | **0.9** | **2.9** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයට බැංකු අංශයෙන් ණය ලබාගැනීම සඳහා වැඩි අරමුදල් ප්‍රමාණයක් පැවතීම මෙම වාසි අතර වේ. මීට අමතරව සාම ක්‍රියාවලිය අඛණ්ඩව පැවතීම නිසා දේශීය ඉල්ලුම වර්ධනය විය. කෙසේ වෙතත් යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ආර්ථිකයේ සමහර අංශවල පැවැති ව්‍යුහාත්මක ගැටළු කර්මාන්ත අංශයේ වර්ධනය කෙරෙහි වක්‍රාකාරයෙන් බාධා ඇති කළේය. එබැවින් මෙම ගැටළු විසඳා ගැනීමට අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම කර්මාන්ත අංශය තුළ ඉහළ වර්ධනයක් ඇතිකර ගැනීමට අවශ්‍යවන වක්‍ර දිරිගැන්වීම් වශයෙන් ක්‍රියා කරනු ඇත. මේ සම්බන්ධයෙන් 2004 වර්ෂයේ අයවැය මගින් ප්‍රකාශ කළ යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන්වල ඇතුලත්වන ගල් අඟුරු විදුලි බලාගාරය, සැලසුම් කර ඇති ආකාරයට ස්ථාපිත කිරීම කර්මාන්ත අංශය සඳහා වාසි දායක වනු ඇත.

2003 අයවැයෙන් ප්‍රකාශිත විදේශ විනිමය ලිහිල්කරණය මගින් ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත වූ සහ සෘජුව හෝ වක්‍රව විදේශයන්හි පදිංචිකරුවන් පාලනය කරන ව්‍යවසායන්ට සීමා රහිතව රුපියල් ණය පහසුකම් ලබා ගැනීමට අවසර ලබා දී ඇත. බලපත්‍රලාභී වාණිජ බැංකු, ජාතික සංවර්ධන බැංකුව සහ ඩී.එෆ්.සී.සී. බැංකුව මගින් පමණක් මෙම ණය ප්‍රදානය කරනු ලබයි. එසේම මෙම ලිහිල්කරණය මගින් ශ්‍රී ලාංකීය නේවාසික

ගැනුම්කරුවකුට ශ්‍රී ලාංකීය නේවාසිකයන් නොවන සැපයුම්කරුවකුගෙන් භාණ්ඩ හා සේවා ලබා ගැනීමේදී ණය ලබා ගැනීමේ කාල සීමාව දින 360 දක්වා දීර්ඝ කර ඇත. මෙහිදි එම සැපයුම්කරු පොලී ගෙවිය යුතු යැයි කියා සිටියහොත් ගෙවිය යුතු පොලිය ජාත්‍යන්තර වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්ට වඩා ඉහළ අගයක් නොවිය යුතුය.

කර්මාන්තවලට තනිව නිෂ්පාදන කටයුතු කරගෙන යා හැකි වන තෙක් සංවර්ධනය කිරීම සඳහා රජය විසින් ඇති කරන ලද ප්‍රථම ඉන්කියුබේටර් වැඩ පිළිවෙල 2003 ජුනි මාසයේදී මොරටුව විශ්ව විද්‍යාලයේදී ආරම්භ කරන ලදී. ආරම්භයේදී මෙම ව්‍යාපෘතිය සඳහා සම් නිෂ්පාදන හා තොරතුරු තාක්ෂණ අංශයේ ව්‍යවසායන් 12 ක් තෝරා ගෙන ඇත. මෙම වැඩ පිළිවෙල යටතේ ව්‍යාපෘති සඳහා කළමනාකරණ පහසුකම් සැපයීම, ව්‍යාපෘතිය පවත්වා ගැනීම සඳහා අඩු පිරිවැයක් සහිත ස්ථානයක් ලබාදීම, නම්‍යශීලී කල්බදු ලබාදීම සහ තාක්ෂණික පහසුකම් එකම ස්ථානයකදී ලබාදීම කරනු ඇත. ශක්‍යතා අධ්‍යයනයන්ගෙන් පසුව පහසුකම් ලැබිය යුතු විභවතාවයන්ගෙන් යුත් අනෙකුත් කර්මාන්ත නුදුරු අනාගතයේදී මෙම ක්‍රමයට ඇතුලත් කරගනු ඇත.

## 4.3 එකතු කළ අගය සහ ධාරිතා උපයෝජනය

2003 දී කර්මාන්ත අංශයේ එකතු කළ අගය නාමික වශයෙන් සියයට 11 කින් වර්ධනය විය. 2002 දී අත්කරගත් සියයට 2.9 හා සසඳන කළ 2003 දී එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 4.7 කින් ඉහළ ගියේය. කම්හලින් පිටවන විට පැවති වටිනාකමින්, අමුද්‍රව්‍ය, විදුලිය සහ ඉන්ධන පිරිවැය අඩු කිරීමෙන් එකතු කළ අගය ගණනය කර ඇත. දේශීය ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් ධාරිතා උපයෝජනය ප්‍රසාරණය වීම, තාක්ෂණික වර්ධනය, ස්ථාවර විනිමය අනුපාතිකයන් පැවැතීම නිසා ආනයනික අමුද්‍රව්‍ය පිරිවැය සීමාවීම සහ ඵලදායිතාවය වර්ධනය වීම එකතු කළ අගය ඉහළ යාම කෙරෙහි හිතකර ලෙස බලපා ඇත. ලාභදායි නොවන නිෂ්පාදන ඒකකයන් වසා දැමීම, තාක්ෂණය වෙනස් කිරීම, අතිරික්ත ශ්‍රමය අඩු කිරීම සහ අනෙකුත් පිරිවැය අඩු කිරීමේ ක්‍රමෝපායන් අනුගමනය කිරීම වැනි ආයතනික ප්‍රතිසංස්කරණයන් එකතු කළ අගය ඉහළ යාමට උපකාරී විය. කෙසේ වුවද විදුලිබලය ඇණ හිටීම, බලශක්ති මිල ගණන් ඉහළ මට්ටමක පැවැතීම සහ ආර්ථිකයෙහි පවතින සමහර ව්‍යුහාත්මක ගැටළු කර්මාන්ත අංශයෙහි එකතු කල අගයෙහි වර්ධන වේගය අඩු කරනු ලැබීය.

2002 දී අත්කරගත් සියයට 1.8 ක වැඩිවීම හා සසඳන කළ කර්මාන්ත අංශයේ ස්ථාපිත ධාරිතාවය 2003 දී සියයට 3.5 කින් ප්‍රසාරණය විය. කෙසේ වුවද ජාත්‍යන්තර සහ දේශීය ආර්ථික වාතාවරණය තව දුරටත් වැඩිදියුණු වන තෙක් ආයෝජකයින් ප්‍රධාන ධාරිතා ප්‍රසාරණ ව්‍යාපෘති සහ නව ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රමාද කිරීම නිසා 2003 දී ධාරිතා ප්‍රසාරණ වේගය මන්දගාමී විය. 2003 දී පිඟන් භාණ්ඩ, සැකසූ ආහාර, රබර් ආශ්‍රිත නිෂ්පාදිත සහ ප්ලාස්ටික් නිෂ්පාදනවල ධාරිතාවය ඉහළ ගියේය. සැකසූ තේ, ඇඟලුම් කර්මාන්තය සඳහා යොදා ගන්නා උපාංග, කෘතිම මල්, පිඟන් මැටි වලින් නිෂ්පාදනය කරන විසිතුරු භාණ්ඩ, කෘතිම මැණික් ගල් සහ තඹ වයර් වැනි අපනයනාභිමුඛ කර්මාන්තවල ධාරිතාවයද 2003 දී ප්‍රසාරණය විය. සමස්ථ ධාරිතා උපයෝජනය 2002 දී සියයට 81 සිට 2003 දී සියයට 85 දක්වා වැඩි විය.

## 4.4 නිෂ්පාදන පිරිවැය, ලාභදායිත්වය සහ සේවා නියුක්තිය

ආයෝජන මණ්ඩලය යටතට නොගැනෙන කර්මාන්ත අංශයෙහි කර්මාන්ත ශාලාවෙන් පිටවන විට පැවති ලාභ අනුපාතික 2003 දී සියයට 14.2 දක්වා ප්‍රතිශත ඒකක 2.3 කින් වර්ධනය විය. 2003 කාර්මික සමීක්ෂණයට අනුව ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත 480 ක මුළු නිෂ්පාදන පිරිවැයට සාපේක්ෂව, නිෂ්පාදන කර්මාන්ත ශාලාවෙන් පිටවන විට පැවති වටිනාකමේ අතිරික්තය පදනම් කරගෙන කර්මාන්ත අංශයේ ලාභ අනුපාතිකය ඇස්තමේන්තු

**4.3 සංඛ්‍යා සටහන**
**කර්මාන්ත අංශයේ එකතු වු අගය**
**(පවත්නා මිල ගණන් අනුව)**

| | කාණ්ඩය | රුපියල් දශ ලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|
| | | 1999 | 2000 | 2001 | 2002 | 2003(අ) | 2002 | 2003(අ) |
| 1. | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 44,503 | 49,031 | 54,282 | 61,550 | 69,708 | 13.4 | 13.3 |
| 2. | රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 55,263 | 69,451 | 71,263 | 77,028 | 84,623 | 8.1 | 9.9 |
| 3. | දැව හා දැව නිෂ්පාදිත | 1,390 | 1,554 | 1,638 | 1,736 | 1,929 | 6.0 | 11.1 |
| 4. | කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,664 | 2,808 | 3,103 | 3,124 | 3,334 | 0.7 | 6.7 |
| 5. | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 13,832 | 17,771 | 19,245 | 22,653 | 25,028 | 17.7 | 10.5 |
| 6. | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 13,817 | 14,240 | 16,010 | 17,273 | 18,477 | 7.9 | 7.0 |
| 7. | මූලික ලෝහ නිෂ්පාදිත | 777 | 959 | 1,131 | 1,306 | 1,463 | 15.5 | 12.0 |
| 8. | සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 7,367 | 7,714 | 8,731 | 9,698 | 11,198 | 11.1 | 15.5 |
| 9. | අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 3,799 | 3,965 | 4,154 | 4,695 | 5,257 | 13.0 | 12.0 |
| | එකතුව | **143,412** | **167,493** | **179,557** | **199,063** | **221,017** | **10.9** | **11.0** |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**4.2 රූප සටහන**
**කාර්මික නිෂ්පාදනයෙහි එකතු කළ වටිනාකම් ප්‍රතිශතය-2003**




1. සකස් කළ ලෝහ නිෂ්පාදිත
2. දව හා දව නිෂ්පාදිත
3. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත
4. ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත
5. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත
6. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත
7. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත
8. මූලික ලෝහ නිෂ්පාදිත
9. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත

කර ඇත. නිෂ්පාදන පිරිවැය වැඩිවීමට වඩා වැඩි වේගයකින් අලෙවිය වැඩිවීම 2003 දී ලාභදායිත්වය වැඩිවීමට හේතු විය. පාරිභෝගිකයින්ගේ සහ ආයෝජකයින්ගේ විශ්වාසනීයත්වය වැඩිවීම නිසා ආර්ථික කටයුතුවල සිදුවූ ප්‍රබෝධය නිෂ්පාදකයින් අනුගමනය කළ කාර්යක්ෂම මිල නියම කිරීමේ ප්‍රතිපත්තීන් සහ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ වලින් ඇතිවූ නව ඉල්ලුම නිසා දේශීය අලෙවිය වැඩිවිය. පහළ පොලී අනුපාතිකයන් පැවතීම, අපතේ යාම් අවම කිරීම, මනා කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ අමුද්‍රව්‍ය කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම නිෂ්පාදන පිරිවැය අඩු වීමට උපකාරී විය. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සුළු වශයෙන් පමණක් අවප්‍රමාණය වීම ආනයනිත අමු ද්‍රව්‍යවල පිරිවැය වැඩිවීම සීමා වීමට හේතු විය. මෙය වඩාත්ම අදාල වූයේ කිරිපිටි, තිරිඟු පිටි සැකසීම, ඇඟළුම්, රසායනික ද්‍රව්‍ය, පොහොර සහ කඩදාසි නිෂ්පාදිතයන් සඳහාය. කෙසේ වුවද රුපියල මඳ වශයෙන් පමණක් අවප්‍රමාණය වීම, අපනයනාභිමුඛ සහ ආනයන ආදේශක කර්මාන්තයන්ගේ ලාභදායිත්වය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. සබන් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය, ආහාර, ඇඟළුම්, සකස් කල ලෝහ නිෂ්පාදිත, අපනයනාභිමුඛ විද්‍යුත් අයිතමයන්, රබර් ආශ්‍රිත නිෂ්පාදන, සැකසූ තේ සහ දුම්කොළ සැකසීම යන කාර්මික උප අංශයන්වල ලාභදායිත්වය වසර තුළදී සැලකිය යුතු ලෙස වර්ධනය විය.

සේවක සංඛ්‍යාව සියයට 3 කින් වැඩිවීම සහ වැටුප් අනුපාතිකයන්හි මධ්‍යස්ථ වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත අංශයේ වැටුප් පිරිවැය 2003 දී සියයට 9.1 කින් වර්ධනය විය. 2003 දී සාපේක්ෂ වශයෙන් අඩු උද්ධමන අනුපාතිකයක් පැවතීම වැටුප් වැඩි කිරීම සඳහා සේවකයින් විසින් කරනු ලබන බලපෑම සීමා වීමට හේතු විය. බොහෝ සමාගම් වැටුප් පිරිවැය අඩුකර ගැනීම සඳහා ඉහළ පිරිවැයක් සහිත නිෂ්පාදන ඒකකයන් පරිබාහිර ආයතනවලට පැවරීම සහ අනියම් හෝ කොන්ත්‍රාත් සේවකයන් බඳවා ගැනීම සිදුකරන ලදී. එසේම කර්මාන්ත කිහිපයක් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ වැඩ පිළිවෙලවල් හඳුන්වා දීම සහ තම සේවකයින් ඉතාමත් උචිත ආකාරයට සේවාවල යෙදවීම නිසා අතිකාල දීමනා අඩුකර ගැනීම තුළින් සමස්ථ වැටුප් පිරිවැය අඩුකර ගන්නා ලදී. සමස්ථ නිෂ්පාදන පිරිවැයෙහි වැටුප් පිරිවැය 2002 දී පැවැති සියයට 11.8 සිට 2003 දී සියයට 11.9 දක්වා ආන්තිකව ඉහළ ගියේය. ශ්‍රම බලකායේ වැඩිවීම සහ නිෂ්පාදනයේ ඉහළයාම පිළිබිඹු කරමින් මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස ආහාර පාන වර්ග හා දුම්කොල නිෂ්පාදිත සහ රසායනික ද්‍රව්‍ය, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන වල වැටුප් පිරිවැය ඉහළ ගියේය. වැටුප් පිරිවැය කොටස පහත වැටුන කාර්මික කාණ්ඩයන් වූයේ සකස් කල ලෝහ නිෂ්පාදිත හා ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනයන්ය. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන, දැව හා දැව නිෂ්පාදනයන් සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන යන කාණ්ඩවල වැටුප් පිරිවැය කොටස සියයට 15 කට වඩා වැඩි විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත යන කාණ්ඩවල වැටුප් පිරිවැය කොටස සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතින.

**4.4 සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභය (අ)**

| කාණ්ඩය | මුළු නිෂ්පාදන පිරිවැය (රු.ද.ල.) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු.ද.ල.) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|
| | 2002 | 2003 | 2002 | 2003 | 2002 | 2003 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 67,450 | 72,905 | 76,474 | 85,205 | 11.8 | 14.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 18,423 | 19,645 | 21,547 | 23,443 | 14.5 | 16.2 |
| 3. දව හා දව නිෂ්පාදිත | 1,252 | 1,398 | 1,418 | 1,598 | 11.7 | 12.5 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 4,077 | 4,479 | 4,577 | 5,044 | 11.0 | 11.2 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 26,216 | 28,451 | 29,556 | 32,778 | 11.3 | 13.2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 17,145 | 18,201 | 19,550 | 21,388 | 12.3 | 14.9 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,928 | 2,024 | 2,154 | 2,337 | 10.5 | 13.4 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 10,827 | 11,907 | 12,084 | 13,655 | 10.4 | 12.8 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 2,942 | 3,273 | 3,250 | 3,686 | 9.5 | 11.2 |
| **එකතුව** | 156,256 | 162,283 | 170,610 | 189,198 | 11.9 | 14.2 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 480 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**4.5 සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තවල දේශීය පිරිවැය ව්‍යුහය (අ)**
**(මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| කාණ්ඩය | දේශීය පිරිවැය (ප්‍රතිශතයන්) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | බලය සහ ඉන්ධන | | වැටුප් | | අමු ද්‍රව්‍ය | | පොලිය | |
| | 2002 | 2003 | 2002 | 2003 | 2002 | 2003 | 2002 | 2003 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 3.0 | 3.1 | 9.4 | 9.8 | 36.9 | 37.1 | 1.7 | 1.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 4.2 | 4.2 | 14.7 | 14.8 | 13.1 | 13.8 | 2.7 | 2.4 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 8.9 | 8.9 | 15.7 | 15.4 | 33.1 | 33.6 | 4.2 | 4.0 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 3.5 | 3.5 | 12.1 | 12.0 | 18.1 | 18.6 | 4.1 | 3.8 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 5.1 | 5.2 | 12.9 | 12.8 | 29.1 | 30.4 | 3.8 | 3.7 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 17.9 | 18.1 | 16.2 | 16.1 | 27.5 | 27.9 | 2.5 | 2.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 8.9 | 9.1 | 10.4 | 10.2 | 34.6 | 34.9 | 3.9 | 3.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 4.1 | 3.9 | 11.1 | 10.8 | 25.2 | 25.8 | 4.0 | 3.6 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4.6 | 4.5 | 12.5 | 12.6 | 33.4 | 33.9 | 2.2 | 1.8 |
| **එකතුව** | **5.5** | **5.5** | **11.8** | **11.9** | **30.2** | **30.6** | **2.6** | **2.4** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 480 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආයෝජන මණ්ඩලය යටතට නොගැනෙන කාර්මික අංශයෙහි මුළු බලශක්ති පිරිවැය 2003 දී නිරපේක්ෂ වශයෙන් සියයට 8.9 කින් වර්ධනය විය. ඉහළ ධාරිතා උපයෝජනය නිසා විදුලිය උපයෝජනය වැඩි වීම සහ ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යාම 2003 දී බලශක්ති පිරිවැය වැඩි වීමට හේතු විය. කෙසේ වුවද බලශක්ති පිරිවැය මුළු පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.5 ක මට්ටමක නොවෙනස්ව පැවතිණි. ඩීසල් සහ ගෑස් මිල ගණන් ඉහළයාම නිසා මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කාණ්ඩයේ බලශක්ති පිරිවැය 2002 දී පැවති සියයට 17.9 සිට 2003 දී සියයට 18.1 දක්වා වැඩි විය. සිමෙන්ති සහ පිඟන් කර්මාන්තයන්හි නිෂ්පාදන පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් බලශක්ති පිරිවැයෙන් සමන්විත වේ. ආහාර, පාන වර්ග සහ දුම්කොළ සහ කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත යන කාණ්ඩයන්හි බලශක්ති පිරිවැය කොටස අඩු අගයක් ගන්නා ලදී.

මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස පොලී පිරිවැය පෙර වසරෙහි වූ සියයට 2.6 සිට 2003 වර්ෂයේ දී සියයට 2.4 දක්වා අඩුවිය. ශ්‍රී ලංකා මහබැංකු පොලී අනුපාතිකය සැලකිය යුතු ලෙස පහළ දැමීම නිසා වාණිජ බැංකුවල ණය දීමේ පොලී අනුපාතිකයන් ක්‍රමයෙන් අඩුවීම පොලී පිරිවැය පහළ යාමට උපකාරී විය. එසේම ව්‍යවසායකයන් විසින් කෙටි කාලීන ණය ගැනීම් අඩුවීමද මුළු ණය පිරිවැය අඩු වීමට උපකාරී විය. පොලී පිරිවැය කැපී පෙනෙන ලෙස අඩු වූ කාර්මික කාණ්ඩයන් වූයේ දැව හා දැව නිෂ්පාදිත, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත, රෙදිපිළි, කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිතයන්ය.

## කර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාවය

මිනිස් පැයක එකතු කළ අගයෙහි මූර්ත වටිනාකම පදනම් කොට ගෙන ඇස්තමේන්තු කරන ලද ශ්‍රම ඵලදායිතාව පෙර වර්ෂයේදී වූ සියයට 0.9 ක වැඩි වීම හා සසඳන කළ 2003 දී සියයට 2.9 කින් වර්ධනය විය. කාර්මික කාණ්ඩ විශාල ප්‍රමාණයක ශ්‍රම ඵලදායිතාවයෙහි ඉහළයාමක් දැකිය හැකි විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 3.5), රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදන (සියයට 2.2), රසායන ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් (සියයට 3.3), සහ මූලික ලෝහ නිෂ්පාදනයන් (සියයට 2) යන කාර්මික කාණ්ඩ වල ශ්‍රම ඵලදායිතාවය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. විශේෂයෙන්ම පිඟන් භාණ්ඩ, සිමෙන්ති, බේකරි, රබර් අත් වැසුම් ආදී කර්මාන්තවල තොරතුරු තාක්ෂණය බහුල වශයෙන් යොදා ගැනීම සහ ස්වයංක්‍රීය නිෂ්පාදන ක්‍රමයන් ස්ථාපිත කිරීම, ශ්‍රම ඵලදායිතාව වර්ධනය වීමට උපකාරී විය. එසේම නිෂ්පාදකයින් මෙහෙයුම් කටයුතු තාර්කීයකරණය කිරීමට දැඩි පරිශ්‍රමයක් දැරීම, සේවාවන් මනාලෙස පැවැරීම තුළින් මිනිස් බලය වඩාත් කාර්යක්ෂම ලෙස යොදා ගැනීම සහ උසස් කළමනාකරණ ක්‍රියා පිළිවෙත් සහ නිපුණතා සංවර්ධන වැඩ සටහන් හඳුන්වා දීම 2003 වසරේ ශ්‍රම ඵලදායිතා වර්ධනයට උපකාරී විය.

**4.3 රූප සටහන**
**කර්මාන්තයන්හි ශ්‍රම ඵලදායිතා දර්ශකය (1995=100)**



**4.6 සංඛ්‍යා සටහන**
**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදායිතා දර්ශකය(අ)**

1995=100

| කාණ්ඩය | 2002 | 2003 | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 122.4 | 126.7 | 3.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 103.6 | 105.9 | 2.2 |
| 3. දව හා දව නිෂ්පාදිත | 96.2 | 98.0 | 1.9 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 98.3 | 98.8 | 0.5 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 125.9 | 130.1 | 3.3 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 107.4 | 109.7 | 2.1 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 97.1 | 98.4 | 1.3 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 114.2 | 116.5 | 2.0 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 103.3 | 105.3 | 1.9 |
| **එකතුව** | **110.1** | **113.3** | **2.9** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 480 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**4.7 සංඛ්‍යා සටහන**
**ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තවල සේවා නියුක්තිය (අ)**

| කාණ්ඩය | 2002 | 2003 | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 24,978 | 25,952 | 3.9 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 28,050 | 28,471 | 1.5 |
| 3. දව හා දව නිෂ්පාදිත | 1,260 | 1,276 | 1.3 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 5,490 | 5,605 | 2.1 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 21,532 | 22,350 | 3.8 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 8,648 | 8,847 | 2.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 763 | 797 | 4.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 11,614 | 12,090 | 4.1 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4,147 | 4,305 | 3.8 |
| **සියලුම කාණ්ඩ** | **106,482** | **109,694** | **3.0** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 480 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### සේවා නියුක්තිය

දේශීය වෙළෙඳපොළ සහ අපනයන වෙළෙඳපොළ පෙරදැරි කර ගත් කර්මාන්තයන්හි වැඩි රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ජනිත වීම පිළිබිඹු කරමින් කර්මාන්ත අංශයේ සේවා නියුක්තිය 2003 දී සියයට 3.4 කින් වර්ධනය විය. ආයෝජන මණ්ඩලයට අයත් සහ ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තයන්හි සේවා නියුක්තිය වසර තුළදී පිළිවෙලින් 3.5 කින් සහ සියයට 3.0 කින් වැඩිවිය.

2003 දී ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තයන්හි නව රැකියා අවස්ථාවන් 14,474 ජනිත විය. වසර තුළදී රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයේ නව රැකියා අවස්ථා 21,075 බිහි විය. ඇඟළුම් කර්මාන්ත 50 වැඩ සටහන, කුඩා අපනයන සැකසුම් කලාප සහ කර්මාන්ත උද්‍යාන වැඩ සටහන් යටතේ ආරම්භ කළ නව කර්මාන්ත ශාලා මගින් මෙම රැකියා අවස්ථාවන් බොහොමයක් ජනිත විය. ආයෝජන ප්‍රවර්ධන කලාපයන් වල සහ නාගරික පෙදෙස් වල පිහිටි ඇඟළුම් නිෂ්පාදකයන්ට පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය නිසා කර්මාන්තශාලා වලට අවශ්‍ය නව රැකියා පුරප්පාඩු පුරවා ගැනීමට නොහැකි විය. රසායන ද්‍රව්‍ය සහ ප්ලාස්ටික් කාර්මික කාණ්ඩයේ සේවා නියුක්තිය 2003 දී සියයට 12.6 කින් අඩු විය. ආයෝජන මණ්ඩලය යටතට නොගැනෙන කර්මාන්ත අංශයේ ඉහළ සේවා නියුක්ති ප්‍රමාණයක් බිහිකළ කාර්මික කාණ්ඩයන් වූයේ ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන, රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනයන්ය. රසායන ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයට අයත් පොහොර මිශ්‍රණ කර්මාන්ත, ප්ලාස්ටික්, රසායන ද්‍රව්‍ය සහ රබර් ආශ්‍රිත කර්මාන්තයන්හි වැඩි රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ජනිත විය. යතුරුපැදි එකලස් කිරීම, විදුලිය සඳහා භාවිතා කරන වයර් සහ විදුලි උපකරණ නිෂ්පාදන අංශ වල ශ්‍රමිකයන් ඉහළ ප්‍රමාණයක් අවශෝෂණය කර ගැනීම හේතුවෙන් සකස් කළ ලෝහ නිෂ්පාදිත කාණ්ඩයේ සේවා නියුක්තිය සියයට 3.5 කින් ඉහළ ගියේය.

## 4.5 ආයෝජනය

### විදේශ ආයෝජනය

පසුගිය වසරේදී ඉහළ යාමක් පෙන්නුම් කළ ශ්‍රී ලංකාව තුළට පැමිණි විදේශ ආයෝජන ප්‍රමාණය 2003 දී තවදුරටත් වර්ධනය විය. සාම ක්‍රියාවලිය අඛණ්ඩව පැවතීම, ශ්‍රම වෙළෙඳපොළ තුළ සිදුකරන ලද ප්‍රතිසංස්කරණ, සාර්ව ආර්ථික කළමණාකරණ කටයුතු ශක්තිමත් වීම, විනිමය අනුපාතිකය ස්ථාවර වීම, ප්‍රාග්ධන ගිණුම තවදුරටත් ලිහිල් කිරීම සහ විනිමය පාලන ලිහිල් කිරීම් 2003 දී විදේශ ආයෝජන වැඩි ප්‍රමාණයක් ආකර්ශනය කර ගැනීමට උපකාරී විය. රජයේ ප්‍රධාන විදේශ ආයෝජන ප්‍රවර්ධන ආයතනය වන ආයෝජන මණ්ඩලය, එහි 16 හා 17 වන වගන්තීන් යටතේ 2003 දී ව්‍යාපෘති 598 ක් අනුමත කළේය. මෙම ව්‍යාපෘතිවල මුළු ආයෝජන සහභාගීත්වය 2003 දී රුපියල් දශ ලක්ෂ 136,121 ක් විය. ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ ව්‍යාපෘතිවල විදේශ ආයෝජන සහභාගීත්වය 2002 දී රුපියල් දශ ලක්ෂ 31,672 (ඇමෙරිකන් ඩොලර් දශ ලක්ෂ 328.1) වූ අතර එය 2003 දී රුපියල් දශ ලක්ෂ 74,979 ක් (ඇමෙරිකන් ඩොලර් දශ ලක්ෂ 776.8) විය. ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි දැනට කර ඇති සමස්ත ආයෝජනය 2002 දී වූ රුපියල් දශ ලක්ෂ 241,470 සිට 2003 දී රුපියල් දශ ලක්ෂ 277,481 දක්වා වැඩි විය.

ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් විවිධ සහනයන් ආයෝජකයින්ට ලබා දී ඇත. මෙයට වරනීය බදු අනුපාතිකයන් පිරිනැමීම, ආයෝජන ගිවිසුම් සඳහා ව්‍යවස්ථාමය සහතිකයක් ලබාදීම, විදේශ විනිමය පාලන නිදහස් කිරීම සහ ලාභයෙන් සියයට සියයක්ම තම රට වලට ගෙන යාම සඳහා අවසර දීම වැනි විවිධ සහනයන් අයත් වේ. ආර්ථිකයේ බොහෝ අංශවල අයිතිය මුළුමනින්ම ලබා ගැනීම සඳහා විදේශිකයන්ට අවසර දී ඇති අතර විදේශීය අයිතිය සීමාකර හෝ තහනම් කර ඇත්තේ අංශ කිහිපයක්

**4.8 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යවසායයන් විසින් දැනට කර ඇති ආයෝජන (අ)**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | විදේශ ආයෝජන (රු.ද.ල.) | | මුළු ආයොජන (රු.ද.ල.) | |
|---|---|---|---|---|---|---|
| | 2002 | 2003(ඇ) | 2002 | 2003(ඇ) | 2002 | 2003(ආ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 143 | 148 | 8,732 | 9773 | 14,679 | 15,774 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 480 | 500 | 25,438 | 26,806 | 39,977 | 40,110 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 22 | 24 | 2,751 | 3,680 | 3,161 | 3,916 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 23 | 25 | 567 | 498 | 1,578 | 1,638 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 129 | 138 | 11,040 | 15,058 | 16,011 | 19,640 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 64 | 66 | 3,574 | 5,217 | 6,763 | 12,487 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 67 | 75 | 5,562 | 6,389 | 7,230 | 8,088 |
| 8. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 156 | 166 | 6,212 | 6,763 | 9,389 | 9,907 |
| 9. සේවා | 559 | 624 | 101,019 | 112,598 | 142,684 | 165,921 |
| **එකතුව** | 1,643 | 1,766 | 164,895 | 186,782 | 241,471 | 277,481 |

(අ) වර්ෂය අවසානයේ එකතු වූ අගය
(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති
(ඇ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**4.4 රූප සටහන**
**අනුමත කළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්**

**4.4.1 රූප සටහන**
**අනුමත කළ සහ ගිවිසගත් ව්‍යාපෘතීන්**




**4.4.2 රූප සටහන**
**අනුමත කළ සහ ගිවිසගත් ආයෝජන**




සඳහා පමණි. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින නිදහස් වෙළෙඳ ගිවිසුම, ආයෝජකයින්ට ඉන්දීය වෙළෙඳපොළට පිවිසීමට මහඟු අවස්ථාවක් සපයා දී ඇත. මෙම පොදු සහනයන්ට අමතරව, 2003 දී ආයෝජන මණ්ඩලය, විශේෂිත ආයෝජන ප්‍රවර්ධන වැඩ පිළිවෙලවල් ගණනාවක් ක්‍රියාත්මක කළේය. ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ගෙන් ද සමන්විත දූත පිරිස් සැලකිය යුතු ප්‍රමාණයක් විදේශීය රටවල් කිහිපයක සංචාරය කළ අතර ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා එම රටවල ප්‍රධාන පෙලේ ව්‍යාපාරික ප්‍රජාවන් සමඟ රැස්වීම් හා සම්මන්ත්‍රණ ගණනාවක් පවත්වා ඇත. සංචාරය කළ මෙම රටවල් අතරට ජර්මනිය, ප්‍රංශය, මැලේසියාව, චීනය සහ ජපානය අයත් වේ. මීට අමතරව ආයෝජන මණ්ඩල නියෝජිතයින් ඉන්දියාව, ජපානය, තායිලන්තය, ජර්මනිය, ප්‍රංශය සහ මැද පෙරදිග යන රටවල ආයෝජන ප්‍රවර්ධන කටයුතු වල නිරත විය. මේ අතර නව ආයෝජන අවස්ථා නිරීක්ෂණය කිරීම සඳහා විදේශීය නියෝජිත කණ්ඩායම් රැ සක් ශ්‍රී ලංකාවට පැමිණියේය. මේ රටවල් අතරට ඉන්දියාව, මැලේසියාව, චීනය, සිංගප්පූරුව, එක්සත් රාජධානිය, තායිලන්තය, මාලදිවයින, නේපාලය, ලැට්වියා, පින්ලන්තය, නෝර්වේ, හංගේරියාව, හා ඩෙන්මාර්කය අයත් වේ. ඉදිරි වසර වලදී මෙම ආයෝජන නිරීක්ෂණ කණ්ඩායම් හරහා ඉහළ ආයෝජන ප්‍රමාණයක් රට තුළට පැමිණේ යැයි අපේක්ෂා කරනු ලබයි.

ආයෝජන මණ්ඩලයේ 17[1] වන වගන්තිය යටතේ 2003 දී ව්‍යාපෘතීන් 418 අනුමත කරනු ලැබූ අතර එයින් 126 ක් මුළුමනින්ම විදේශ ආයෝජන හිමිකම් සහිත ව්‍යවසායන් වූ

1 ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ විශේෂ සුදුසුකම් ලැබීමේ නිර්ණායකයන් සපුරාලන සමාගම් වලට විශේෂ සහන ලබාදීමේ බලය ආයෝජන මණ්ඩලයට ඇත. මෙම සහන දෙනු ලබන්නේ ආයෝජන මණ්ඩලයේ රෙගුලාසි වලට යටත්ව දැනට පවත්නා හඳුනාගත් රෙගුලාසි වෙනස් කිරීම සහ ක්ෂමාවන් දීම තුළිනි. මෙම රෙගුලාසි වලට දේශීය ආදායම්, රේගු, විනිමය පාලන, ආනයන පාලන, සමාගම් ලියාපදිංචි කිරීම්, නාවික, මූල්‍ය සහ ගුවන් කටයුතු ඇතුළත් වේ.

**4.9 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම්**

| කාණ්ඩය | සේවා නියුක්තිය දෙසැම්බර් අවසානයට | | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශලක්ෂ | |
|---|---|---|---|---|
| | 2002 | 2003(අ) | 2002 | 2003(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 14,448 | 13,485 | 13,609 | 15,381 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 280,234 | 301,309 | 192,096 | 207,03 |
| 3. දව හා දව නිෂ්පාදිත | 1950 | 2024 | 856 | 1,385 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,065 | 2135 | 1,266 | 12,822 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 31,716 | 27,696 | 28,621 | 33,282 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 13,547 | 10,166 | 8,997 | 9,126 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5,793 | 6,740 | 9,909 | 17,199 |
| 8. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 32,443 | 30,438 | 18,983 | 21,766 |
| 9. සේවා(ආ) | 34,560 | 37,041 | 24,618 | 29,593 |
| **එකතුව** | **416,756** | **431,050** | **298,755** | **366,605** |

(අ) තාවකාලික
(ආ) ශ්‍රීලංකන් ගුවන් සමාගම හැර

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**4.10 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩල ව්‍යවසායන් හි අනුමත කළ හා ගිවිස ගත් ආයෝජන සහ සේවා නියුක්තිය**

| ව්‍යාපෘති ගණන | 2002 (අ) | | | | 2003 (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු කළ ආයෝජන (රු. දශ ලක්ෂ) | | සේවා නියුක්තිය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු කළ ආයෝජන (රු. දශ ලක්ෂ) | | සේවා නියුක්තිය |
| | | විදේශීය | දේශීය | | | විදේශීය | දේශීය | |
| 17 වන වගන්තිය යටතේ අනුමත කළ ව්‍යාපෘතීන් | 297 | 31,672 | 32,404 | 52,024 | 418 | 74,979 | 56,827 | 55,497 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘතීන් | 177 | 15,943 | 15,625 | 31,710 | 215 | 43,259 | 37,349 | 33,156 |
| 16 වන වගන්තිය යටතේ අනුමත කළ ව්‍යාපෘතීන් | 206 | 4,881 | 1,136 | 7,508 | 180 | 3,432 | 884 | 4,862 |

(අ) සංශෝධිත
(අ) තාවකාලික

අතර 107 ක් දේශීය හා විදේශීය බද්ධ ව්‍යාපාර විය. ඉතිරිය මුළුමනින්ම දේශීය හිමිකම් සහිත ව්‍යවසායයන් විය. 2002 දී සියයට 49.4 ක් වූ අනුමත කරන ලද ව්‍යාපෘතීන් ගේ විදේශ ආයෝජන සහභාගීත්වය 2003 දී සියයට 56.9 දක්වා වැඩි විය. 2003 දී අනුමත කළ ව්‍යාපෘති වලින් 182 ක් හෙවත් සියයට 44 ක් කාර්මික අංශයේ වූ අතර ඉතිරිය සේවා හා කෘෂිකාර්මික අංශයේ ව්‍යාපෘතින් විය. කාර්මික අංශයේ ව්‍යාපෘති අතරින් 39 ක් රෙදිපිළි හා ඇඟළුම් කාණ්ඩයේද, 35 ක් ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයේද, 28 ක් රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයේද, 27 ක් සකස් කල භෝග නිෂ්පාදන කාණ්ඩයේද, 13 ක් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කාණ්ඩවලටද අයත් විය. 2003 දෙසැම්බර් අවසන් වන විට ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ව්‍යාපෘති 4,322 ක් අනුමත කර තිබුණි.

2003 දී ව්‍යාපෘති සංඛ්‍යාව මෙන්ම, ගිවිසගත් ව්‍යාපෘති වල මුළු ආයෝජන ප්‍රමාණය ද ඉහළ ගියේය. ගිවිසගත් ව්‍යාපෘතිවල විදේශ ආයෝජන කොටස 2002 දී වූ සියයට 50.5 සිට 2003 දී සියයට 53.7 දක්වා වැඩි විය. 2003 දී ගිවිසගත් මුළු ආයෝජනවලින් සියයට 27.5 ක් කාර්මික අංශයද, සියයට 72.5 ක් සේවා හා කෘෂිකාර්මික අංශයද අවශෝෂණය කර ගෙන ඇත. කාර්මික අංශය තුළ විශාලතම ආයෝජන කොටස වන රුපියල් දශ ලක්ෂ 10,284 ක් ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩය විසින් අවශෝෂණ කර ගෙන ඇති අතර රුපියල් දශ ලක්ෂ 3,956ක් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩය විසින් අවශෝෂණය කර ගෙන ඇත.

ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිස ගන්නා ලද ව්‍යාපෘති වලින් 45 ක් 2003 දී වාණිජ කටයුතු ආරම්භ කළේය. මෙම ව්‍යාපෘති වලින් 24 ක් කර්මාන්ත අංශයේ වූ අතර ඉතිරිය සේවා හා කෘෂිකාර්මික අංශයේ විය. 2003 දෙසැම්බර් අග වන විට ආයෝජන මණ්ඩලය ව්‍යාපෘති 2,829 ක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. 2003 දෙසැම්බර් 31 දිනට ගිවිසගත් මුළු ව්‍යාපෘතින් ගෙන් 1,464 ක් රුපියල් දශ ලක්ෂ 241,581 ක ආයෝජන සහභාගිත්වයක් සහිතව වාණිජ කටයුතුවල නිරත විය. මෙම ව්‍යාපෘතින්ගේ විදේශ ආයෝජන සහභාගිත්වය මුළු ආයෝජනවලින් සියයට 53.8 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 129,864 ක් විය. වාණිජ කටයුතුවල නිරත වූ ව්‍යාපෘතින්

**4.5 රූප සටහන**
**ආයෝජන මණ්ඩල ව්‍යාපෘති විසින් දැනට කර ඇති ආයෝජන**




අතරින් සියයට 82.6 ක් හෙවත් ව්‍යාපෘති 1,209 ක් අපනයන සැකසුම් කලාපයන්ගෙන් පිටත පිහිටා තිබූ අතර ව්‍යාපෘති 255 ක් අපනයන ප්‍රවර්ධන කලාප, තොරතුරු තාක්ෂණ උද්‍යාන හා කාර්මික ජනපද වැනි විශේෂිත කාර්මික ප්‍රදේශවල ස්ථානගත වී තිබුණි. වාණිජ කටයුතුවල නිරත වූ ව්‍යාපෘති 1,464 න් 938 ක් කාර්මික අංශයේ වූ අතර ඉතිරි 526 සේවා හා කෘෂිකාර්මික අංශයේ විය. කාර්මික අංශයේ ව්‍යාපෘතිවලින් 357 ක් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයේද, 128 ක් ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයේද, 122 ක් රසායනික ද්‍රව්‍ය, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයේද 65 ක් සකස් කළ ලෝහ නිෂ්පාදන කාණ්ඩයේද විය. මෙම ව්‍යාපෘති මගින් පුද්ගලයින් 325,945 සඳහා රැකියා අවස්ථා ජනිත කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

2002 දී ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති 206 හා සසඳන කළ 2003 දී ආයෝජන මණ්ඩල පනතේ 16[2] වන වගන්තිය යටතේ ව්‍යාපෘති 180 ක් අනුමත කර ඇත. 2003 දී අනුමත කළ ව්‍යාපෘති වලින් 108 ක් මුළුමනින්ම විදේශ හිමිකම් සහිත ඒවා වූ අතර ඉතිරිය විදේශීය හා දේශීය බද්ධ ව්‍යාපාර සමාගම් විය. අනුමත කළ මෙම ව්‍යාපෘති 180 න් 149 ක් සේවා අංශයේ ද ඉතිරිය කාර්මික අංශයේ ද විය. මෙම ව්‍යාපෘතිවල විදේශ ආයෝජන කොටස මුළු ආයෝජනවලින් සියයට 79.5 ක් විය. මෙම ව්‍යාපෘති මගින් රැකියා අවස්ථා 4,862 ජනනය කරනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. 16 වන වගන්තිය යටතේ අනුමත කළ ව්‍යාපෘති වලින් 691 ක්, 2003 දෙසැම්බර් අවසානයේදී රුපියල් දශ ලක්ෂ 27,526 ක ආයෝජන සහභාගිත්වයක් සහිතව වාණිජ කටයුතුවල නිරත වී තිබුණි. මුළු ආයෝජනයෙන් සියයට 58 ක් විදේශ ආයෝජන විය. මෙම ව්‍යාපෘතීන් පුද්ගලයන් 40,015 කට රැකියා අවස්ථා සපයනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

**4.11 සංඛ්‍යා සටහන**
**වාණිජ කටයුතුවල නිරත ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්**

| කලාපය/උද්‍යානය | 2002 | 2003 (අ) |
|---|---|---|
| කටුනායක අපනයන සැකසුම් කලාපය | 90 | 89 |
| බියගම අපනයන සැකසුම් කලාපය | 61 | 60 |
| කොග්ගල අපනයන සැකසුම් කලාපය | 19 | 20 |
| මහනුවර කාර්මික උද්‍යානය | 11 | 11 |
| මීරිගම අපනයන සැකසුම් කලාපය | 11 | 12 |
| මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය | 7 | 7 |
| සීතාවක කාර්මික උද්‍යානය | 20 | 17 |
| වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | 13 | 13 |
| මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය | 1 | 1 |
| මාවතගම අපනයන සැකසුම් උද්‍යානය | 4 | 4 |
| පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය | 3 | 4 |
| හොරණ අපනයන සැකසුම් කලාපය | 9 | 10 |
| තොරතුරු තාක්ෂණ උද්‍යානය ලෝක වෙළඳ මධ්‍යස්ථානය | 6 | 6 |
| අපනයන සැකසුම් කලාපයන්ගෙන් පිටත | 1,164 | 1,209 |
| එකතුව | 1,419 | 1,464 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල

## දේශීය ආයෝජන

2003 දී ශ්‍රී ලාංකික ආයෝජකයන්ට අයත් ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් අනුමත කිරීම නිසා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද දේශීය ව්‍යාපෘතීන්ගේ ආයෝජන කොටස සියයට 75.4 කින් වැඩි විය. කෙසේ වුවද 2003 දී විදේශ ආයෝජන විශාල වශයෙන් වැඩිවීම නිසා 2003 දී දේශීය ආයෝජන කොටස වූ සියයට 43.1 ක ප්‍රමාණය 2002 දී පැවැති සියයට 50.5 ට වඩා අඩු විය. අනුමත කරන ලද දේශීය ආයෝජන සහභාගිත්වයෙන් රුපියල් දශ ලක්ෂ 41,981 ක් සේවා සහ කෘෂි කාර්මික අංශය විසින් අවශෝෂණය කර ගත් අතර ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයේ වැඩි සහභාගිත්වයක් සහිතව කාර්මික අංශය රුපියල් දශ ලක්ෂ 14,846 ක් අවශෝෂණය කර ගෙන ඇත. ගිවිසගත් ව්‍යාපෘතීන්හි දේශීය ආයෝජන සහභාගිත්වය ද 2003 දී විශාල වශයෙන් වැඩි විය. ශ්‍රී ලාංකික හා විදේශ ආයෝජකයන්ගෙන් සමන් විත බද්ධ ව්‍යාපාර ප්‍රමාණය අඩු වීම නිසා ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘතීන්හි දේශීය ආයෝජන සහභාගිත්වය 2003 දී අඩු විය.

ව්‍යවසාය සංවර්ධන, කාර්මික ප්‍රතිපත්ති සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යංශයට අනුව 2003 වර්ෂය අවසාන වන විට ව්‍යවසායන් 1,588 ක් අමාත්‍යංශය යටතේ ලියා පදිංචි වී තිබුණි. මෙම ව්‍යාපෘතීන්හි මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 113,977 ක් වූ අතර එමගින් රැකියා අවස්ථා 278,397 ක් ජනනය කරනු ඇත. මෙම ආයෝජනයන්ගෙන් විශාලතම කොටස (රුපියල් දශ ලක්ෂ 29,660 ක්) රසායනික, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩය විසින් අවශෝෂණය කර ගෙන ඇති අතර ඉතිරිය පිළිවෙලින් ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන, (රුපියල් දශ ලක්ෂ 23,849 ක්), රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන (රුපියල් දශ ලක්ෂ 20,727 ක්), ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (රුපියල් දශ ලක්ෂ 12,930 ක්)

2 ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තියෙන් අවසර දෙනු ලබන්නේ රටේ සාමාන්‍ය නීතිය යටතේ අවසර ලැබෙන විදේශ ආයෝජන සඳහා පමණි. එනම් එම ව්‍යවසායන්ට දේශීය ආදායම්, රේගු සහ විනිමය පාලන නීති අදාල වනු ඇත.

සහ සකස් කළ ලෝහ නිෂ්පාදන (රුපියල් දශ ලක්ෂ 10,110) යන කාර්මික කාණ්ඩයන් විසින් අවශෝෂණය කර ගෙන ඇත. මෙම ව්‍යවසායන්ගෙන් 1,136 ක් රුපියල් දශ ලක්ෂ 101,200 ක ඇස්තමේන්තු ගත ආයෝජන ප්‍රමාණයන් සහිතව කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථානගතවී ඇති අතර ව්‍යවසායන් 218 ක් රුපියල් දශ ලක්ෂ 7,684 ක ඇස්තමේන්තු ගත ආයෝජනයක් සහිතව ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථානගත වී ඇත. මේ අනුව අමාත්‍යාංශයෙහි ලියාපදිංචි වී ඇති ව්‍යවසායන්ගෙන් සියයට 85 ක් මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ස්ථානගත වී ඇති අතර එය මුළු ආයෝජන ප්‍රමාණයෙන් සියයට 96 ක් වේ.

## 4.6 කර්මාන්ත අංශයට සපයා ඇති ණය පහසුකම්

2003 දී කර්මාන්ත අංශයේ දිගු හා කෙටි කාලීන ප්‍රධාන ණය මූලාශ්‍රයන් වූයේ විශාල වශයෙන් වාණිජ බැංකු, සංවර්ධන බැංකු හා විශේෂිත බැංකුවලින් ණය ගැනීම සහ සුළු වශයෙන් වාණිජ පත්‍ර හා ණයකර නිකුත් කිරීම වේ. වර්ෂය තුළදී වාණිජ බැංකු මගින් සපයන ලද ණය මුදල් වල ඉහළ වර්ධනයක් දැකිය හැකි විය. 2003 දී ජාතික සංවර්ධන බැංකුව සහ ඩී.එෆ්.සී.සී. බැංකුව විසින් සපයන ලද දිගු හා මැදි කාලීන ණය ප්‍රමාණය සියයට 28 කින් වර්ධනය විය. ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 60 කින් සමන්විත ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය ඇතිව 2002 දී ව්‍යවසාය සංවර්ධන, කාර්මික ප්‍රතිපත්ති සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලද 'සහන්‍යා' ණය යෝජනා ක්‍රමය යටතේ කොමර්ෂල් බැංකුව, ඩී.එෆ්.සී.සී. බැංකුව, සම්පත් බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ණය සපයා ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගන්නා ණය සඳහා ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව අවුරුදු 10 ක් වන අතර වර්තමාන පොලී අනුපාතිකය සියයට 11-14 ත් අතර පරාසයක පවතී.

සෘජු මූල්‍ය ණය පහසුකම් සැලකිය යුතු ලෙස වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස ජාතික සංවර්ධන බැංකුව විසින් 2002 දී අනුමත කළ රුපියල් දශ ලක්ෂ 3,049 ක ණය ප්‍රමාණය 2003 දී රුපියල් දශ ලක්ෂ 4,834 දක්වා වැඩිවිය. 2002 දී ජාතික සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද සෘජු මූල්‍ය පහසුකම් 2002 දී වූ රුපියල් දශ ලක්ෂ 2,531 සිට 2003 දී රුපියල් දශ ලක්ෂ 4,130 දක්වා වැඩි විය. කෙසේ වුවද දැනට පවතින ණය යෝජනා ක්‍රමයන් යටතේ ලැබී ඇති අරමුදල් විශාල ප්‍රමාණයක් මේ වන විට භාවිතයට ගෙන තිබීම හේතු කොට ගෙන, ජාතික සංවර්ධන බැංකුව විසින් 2002 දී අනුමත කළ රුපියල් දශ ලක්ෂ 506 ක් වූ ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය 2003 දී රුපියල් දශ ලක්ෂ 223 දක්වා අඩු විය. 'සහන්‍යා' ණය යෝජනා ක්‍රමය යටතේ ජාතික සංවර්ධන බැංකුව කර්මාන්ත අංශය සඳහා රුපියල් දශ ලක්ෂ 87 ක ණය පහසුකම් අනුමත කර ඇත. ජාතික සංවර්ධන බැංකුව විසින් 2003 දී අනුමත කළ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 44 ක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩයට අයත් ව්‍යාපෘති 95 ක් සඳහා ද, සියයට 43 ක්, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයට අයත් ව්‍යාපෘති 69 ක් සඳහා ද අනුමත කර ඇත.

**4.12 සංඛ්‍යා සටහන**
**ඩීඑෆ්සීසී බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව විසින් කර්මාන්ත අංශයට සපයා ඇති මූල්‍ය පහසුකම් - 2003 (අ)**

| කාණ්ඩය | ජාතික සංවර්ධන බැංකුව: අනුමත කළ ප්‍රතිමූල්‍ය කළ පහසුකම් - සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සෘජු මූල්‍ය පහසුකම් (ආ) - සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | ප්‍රාග්ධන සහභාගීත්වය - සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | එකතුව - සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | ඩීඑෆ්සීසී බැංකුව: අනුමත කළ ණය - සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | මුළු එකතුව - සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 38 | 61 | 44 | 1,880 | 13 | 3 | 95 | 1,944 | 177 | 1,903 | 272 | 3,847 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 8 | 2 | 28 | 254 | 14 | 1 | 50 | 257 | 91 | 714 | 141 | 971 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 13 | 10 | 7 | 13 | 2 | 0 | 22 | 23 | 31 | 221 | 53 | 244 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 4 | 2 | 4 | 3 | - | - | 8 | 6 | 41 | 307 | 49 | 313 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 13 | 88 | 55 | 1,795 | 1 | 0 | 69 | 1,884 | 51 | 623 | 120 | 2,507 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 8 | 0 | 15 | 2 | 3 | 0 | 26 | 2 | 26 | 241 | 52 | 243 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 10 | 14 | 8 | 7 | 2 | 0 | 20 | 21 | 19 | 111 | 39 | 132 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 3 | 3 | 1 | 1 | - | - | 4 | 4 | 58 | 877 | 62 | 881 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 43 | 43 | 111 | 175 | 2 | 0 | 156 | 218 | - | - | 156 | 218 |
| **එකතුව** | **140** | **223** | **273** | **4,130** | **37** | **4** | **450** | **4,359** | **494** | **4,997** | **944** | **9356** |

(අ) තාවකාලික
(ආ) ව්‍යාපෘති සහ උපකරණ මූල්‍ය ණය පමණි

මූලයන්: ඩීඑෆ්සීසී බැංකුව
ජාතික සංවර්ධන බැංකුව

2002 දී කාර්මික ව්‍යාපෘති 315 ක් සඳහා අනුමත කරන ලද රුපියල් දශ ලක්ෂ 4,190 හා සසඳන කළ ඩී.එෆ්.සී.සී.බැංකුව 2003 දී කාර්මික ව්‍යාපෘති 494 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 4,997 ක ණය ප්‍රමාණයක් අනුමත කර ඇත. 2003 දී ඩී.එෆ්.සී.සී. බැංකුව රුපියල් දශ ලක්ෂ 1,903 ක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩයට අයත් ව්‍යාපෘති 177 ක් සඳහා ද රුපියල් දශ ලක්ෂ 714 ක් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයට අයත් ව්‍යාපෘති 91 ක් සඳහා ද, රුපියල් දශ ලක්ෂ 623 ක් රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයට අයත් ව්‍යාපෘති 51 ක් සඳහා ද රුපියල් දශ ලක්ෂ 877 ක් සකස් කළ ලෝහ නිෂ්පාදන කාණ්ඩයට අයත් ව්‍යාපෘති 58 ක් සඳහා ද අනුමත කර ඇත.

වාණිජ බැංකු අත්තිකාරම් සහ තැන්පතු පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වනු ලබන ත්‍රෛමාසික සමීක්ෂණයට අනුව, වාණිජ බැංකු විසින් කර්මාන්ත අංශයට සැපයූ ණය ප්‍රමාණය 2002 පළමු නව මාසය තුළදී සපයන ලද රුපියල් දශ ලක්ෂ 37,002 හා සසඳන කල 2003 මුල් නව මාසය තුළදී රුපියල් දශ ලක්ෂ 41,501 දක්වා සියයට 12.2 කින් වැඩි වී ඇත.

## 4.7 කර්මාන්ත ස්ථාන ගත වීම

කර්මාන්ත වැඩි ප්‍රමාණයක් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි ස්ථාන ගත වී ඇත. සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම, ආදායම් ජනනය කිරීම සහ රටපුරා සමාන පදනමක් මත ස්වභාවික සහ මිනිස්බල සම්පත් ඵලදායි ලෙස යොදා ගැනීම වැනි කර්මාන්ත ප්‍රතිපත්තිය තුළ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා රටෙහි සෑම ප්‍රදේශයකම කර්මාන්ත ව්‍යාප්ත කිරීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වුවද ප්‍රාදේශීය වශයෙන් මූලික යටිතල පහසුකම් නොමැති වීම, ප්‍රාදේශීය මධ්‍යස්ථාන රටෙහි ප්‍රධාන වරාය හා ගුවන් තොටුපල් සම්බන්ධ කරන මාර්ග පද්ධතිය දුර්වල වීම හේතුවෙන් අමු ද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය ප්‍රවාහනය ප්‍රමාද වීම, ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ව්‍යාප්ත වීමට සහ ආයෝජන අධෛර්යමත් වීමට හේතු වී ඇත. නාගරික දිස්ත්‍රික්කයන් හි කර්මාන්තශාලා ඒකරාශී වීම නිසා එම ප්‍රදේශවල මාර්ග තද බදය ඇතිවීම, පරිසර දූෂණය, දේපල මිල ගණන් ඉහළයාම, කර්මාන්ත පරිශ්‍රයන් සඳහා ගෙවිය යුතු බදු කුලී ඉහළයාම සහ එම දිස්ත්‍රික්කවල සේවය කරන සේවකයන්ට නවාතැන් පහසුකම් නොමැති වීම ආදීය ගැටළු වලට මුහුණ දීමට සිදු වී ඇත. කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම සඳහා පසුගිය රජයන් මගින් රාජ්‍ය මූල්‍ය දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම සහ කාර්මික උද්‍යාන, කාර්මික ජනපද හා අපනයන සැකසුම් කලාප ආරම්භ කිරීම වැනි ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබුවද ඒවා එතරම් සාර්ථක වී නැත. සියළුම ප්‍රදේශයන් සහ රටෙහි ප්‍රධාන වරාය සහ ගුවන් තොටුපලවල් සම්බන්ධ කෙරෙන අධිවේගී මාර්ග පද්ධතියක් ගොඩනංවන තුරු කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීමේ රජයේ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වනු ඇත.

ඉහළ ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීම සහ ප්‍රාදේශීයව ස්වභාවික සම්පත් භාවිතය ධෛර්යමත් කිරීම සඳහා 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු පිහිටුවන ලදී. මෙම කමිටු විසින් අදාළ ප්‍රදේශවල ආයෝජකයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමට ගතයුතු ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම සහ කාර්මික උද්‍යාන ලෙස දියුණු කිරීමට සුදුසු භූමි ප්‍රදේශ නිර්දේශ කරනු ඇත. මෙම කර්මාන්ත උද්‍යාන සඳහා මහා මාර්ග, විදුලිය, ජලය සහ දුරකථන වැනි මූලික යටිතල පහසුකම් සපයා ඇත. ව්‍යවසාය සංවර්ධන, කාර්මික ප්‍රතිපත්ති හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට අනුව 2003 දෙසැම්බර් අවසාන වන විට කාර්මික උද්‍යාන 15 ක් පමණ රටෙහි විවිධ ප්‍රදේශවල සංවර්ධනය කර ඇත. මෙම වැඩ සටහන යටතේ සංවර්ධනය කළ මුළු භූමි ප්‍රමාණය අක්කර 463 ක් වේ. මෙම කාර්මික උද්‍යානයන් හි ඇති බිම් කොටස් 351 න් බිම් කොටස් 263 ක් සුදුසු ආයෝජකයින් සඳහා වෙන් කර දී තිබේ. 2003 අවසානයේ දී ඒකක 125 ක වාණිජ කටයුතු ආරම්භ කර තිබුණු අතර එමගින් පුද්ගලයන් 11,000 කට වැඩි ප්‍රමාණයකට සේවා නියුක්ති අවස්ථාවන් සපයා දී ඇත. එසේම තවත් කර්මාන්ත ඒකක 34 ක් කර්මාන්තශාලා ඉදිකිරීමේ විවිධ අදියර වල පසුවිය. මෙම කාර්මික උද්‍යාන සම්පූර්ණ කිරීමෙන් පසුව පුද්ගලයන් 31,050 කට සෘජු හා වක්‍ර සේවා නියුක්ති අවස්ථා සපයා දීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. මෙම වැඩසටහන යටතේ 16 වන කාර්මික උද්‍යානය 2003 අවසානයේදී කළුතර දිස්ත්‍රික්කයේ ආරම්භ කරනු ලැබූ අතර එහි පළමු වන අදියර යටතේ අක්කර 55 ක් තුළ අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරනු ඇත. මෙම කාර්මික උද්‍යානය තුළ කර්මාන්ත ඒකක 15-20 පමණ ස්ථාපනය කරනු ලබන අතර 2004 ජූනි වන විට මෙම උද්‍යානය සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. මීට අමතරව බටඅත ග්‍රාමයේ අක්කර 105 ක භූමි භාගයක් තුළ සම්භාණ්ඩ කර්මාන්තය සඳහා විශේෂයෙන් වෙන් වූ කාර්මික සංකීර්ණයක් ආරම්භ කර ඇති අතර 2004 දී එහි වැඩකටයුතු සම්පූර්ණ කිරීමට ඉලක්ක කර ඇත. ආයෝජකයින් තිදෙනෙක් දැනටමත් කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර අනිකුත් ආයෝජකයන් කර්මාන්තශාලා ගොඩනැගිලිවල සැලසුම් සකස් කරමින් සිටී.

ව්‍යවසාය සංවර්ධන, කාර්මික ප්‍රතිපත්ති හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය හා ආයෝජන මණ්ඩලය යටතේ (16 හා 17 වන වගන්තිය සහ ඇඟළුම් කම්හල් 200 වැඩ සටහන) 2003 අවසානයේ දී ලියා පදිංචි කාර්මික ව්‍යවසායන් ප්‍රමාණය 3,902 ක් විය. මෙයින් ව්‍යසායන් 2,104 ක් හෙවත් සියයට 53.9 ක් කොළඹ දිස්ත්‍රික්කයේද, ව්‍යසායයන් 796 ක් හෙවත් සියයට 20.4 ක් ගම්පහ දිස්ත්‍රික්කයේද, 1,002 ක් වූ ඉතිරි ව්‍යසායයන් ප්‍රමාණය සෙසු දිස්ත්‍රික්ක තුළද පිහිටුවා ඇත. 2003 වසර අවසන් වන විට කාර්මික ව්‍යසායයන් 1,567ක් පමණ අමාත්‍යාංශයේ ලියා පදිංචි වී තිබුණි. වසර තුළදී, නව ව්‍යාපෘතීන් 106 ක් ආරම්භ කරනු ලැබූ අතර ව්‍යාපෘති 24 ක්

වසා දමා ඇත. 2002 දී පැවැති සංසංදනාත්මක සංඛ්‍යා පිළිවෙලින් 69 හා 169 ක් විය. 1567ක් වූ මුළු ව්‍යවසායයන්ගෙන් 1,121 ක් හෙවත් සියයට 71.5ක් කොළඹ දිස්ත්‍රික්කයේද ව්‍යවසායන් 213 ක් හෙවත් සියයට 13.6 ගම්පහ දිස්ත්‍රික්කයේද, ඉතිරි ව්‍යසායයන් 233 අනෙකුත් දිස්ත්‍රික්කවලද ස්ථාන ගත වී තිබුණි.

මූලික යටිතල පහසුකම් සහිතව කර්මාන්ත ඒකක ආයෝජකයින්ට ලබාදීම සඳහා ආයෝජන මණ්ඩලය අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යාන ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙයට කටුනායක, බියගම, කොග්ගල පිහිටි අපනයන සැකසුම් කලාප සහ මාවතගම පොල්ගහවෙල, මීරිගම, මල්වත්ත හොරණ සහ වතුපිටිවල පිහිටි කුඩා අපනයන සැකසුම් කලාප සහ සීතාවක, මිරිජ්ජවිල සහ මහනුවර පිහිටි කාර්මික උද්‍යාන සහ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයෙහි පිහිටි තොරතුරු තාක්ෂණ උද්‍යානය ඇතුලත් වේ. ආයෝජන මණ්ඩලයට අනුව 2003 අවසානයේදී අපනයන සැකසුම් කලාප හා උද්‍යානවල ව්‍යාපෘති 254 ක් පමණ වාණිජ කටයුතු ආරම්භ කර තිබුණි. මේ අතරින් 89 ක් වූ ඉහළම කාර්මික ඒකක සංඛ්‍යාව කටුනායක අපනයන සැකසුම් කලාපයේද, 60 ක් බියගම අපනයන සැකසුම් කලාපයේද, 20 ක් කොග්ගල අපනයන සැකසුම් කලාපයේද, 17 ක් සීතාවක කාර්මික උද්‍යානයේද පිහිටා තිබුණි. රුපියල් දශ ලක්ෂ 37,678 ක ඇස්තමේන්තු ගත ආයෝජනයක් සහිත මෙම ව්‍යසායයන් 254 මගින් පුද්ගලයින් 100,850 කට සෘජු සේවා නියුක්ති අවස්ථා සපයා ඇත. ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ තවත් ව්‍යාපෘති 1,209 ක් 2003 අවසානයේ දී අපනයන සැකසුම් කලාප/කාර්මික උද්‍යානවලින් පිටත පිහිටුවා තිබුණි. මෙම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු ගත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 203,883 ක් වූ අතර එමගින් පුද්ගලයන් 225,075 කට සෘජු සේවා නියුක්ති අවස්ථා සපයා ඇත.

ඇඟළුම් කම්හල් 200 වැඩ සටහන යටතේ, 2002 දෙසැම්බර් අවසානයේදී වූ ඇඟළුම් කම්හල් 189 සමග සසඳන විට 2003 වර්ෂයේ දෙසැම්බර් අවසන් වන විට දිස්ත්‍රික්ක 21 ක් තුළ ඇඟළුම් කම්හල් 180 ක් වාණිජ කටයුතුවල නිරත විය. මෙම කම්හල් 180 න්, 32 ක් ගම්පහ හා කොළඹ දිස්ත්‍රික්කයන්හිද ඉතිරි කම්හල් සෙසු දිස්ත්‍රික්ක 19 තුළද, ස්ථාන ගත වී තිබුණි. එම කම්හල් 148 න්, 16 ක් මහනුවරද, 14 බැගින් පුත්තලම, කුරුණෑගල සහ රත්නපුර දිස්ත්‍රික්කවලද, 10 බැගින් කළුතර, නුවරඑළිය හා අනුරාධපුර දිස්ත්‍රික්කවලද, 8 ක් බදුල්ල දිස්ත්‍රික්කයේද පිහිටා තිබුණි.

## 4.8 ආංශික ක්‍රියාකාරීත්වය

### පෞද්ගලික අංශයේ කර්මාන්ත

**රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත**

2002 දී අත්කර ගත් සියයට 1.2 ක වර්ධනය සමග සසඳන කළ කම්හල් කර්මාන්ත නිමැවුමෙන් සියයට 40 කට දායක වන රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත කාණ්ඩය 2003 දී සියයට 2.7 කින් වර්ධනය විය. මෙම කාණ්ඩයේ නිමැවුමෙන් සියයට 90 ක් සඳහා ඇඟළුම් නිෂ්පාදන දායක වේ. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත උප කාණ්ඩයන්, 2003 දී පිළිවෙලින් සියයට 1.8, සියයට 2.6 හා සියයට 5.9 කින් වර්ධනය විය. මෙම නිෂ්පාදන කාණ්ඩය 2003 පෞද්ගලික අංශයේ කර්මාන්තවල වර්ධනයට සියයට 23 කින් දායක විය. 2002 අවසාන භාගයේ සිට වර්ධනය වීමට පටන් ගත් ඇඟළුම් අපනයන ඇණවුම් ඉරාක යුද්ධය අවසන් වීමත් සමග තවදුරටත් වර්ධනය වූ අතර 2003 ප්‍රථම භාගයේදී ඇඟළුම් නිෂ්පාදන සියයට 9.8 ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත් පසුගිය වසරේ පැවැති ඉහළ නිෂ්පාදන පදනම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පැවති තියුණු තරඟකාරීත්වය නිසා තෙවැනි කාර්තුවේ දී ඇඟළුම් නිෂ්පාදන සියයට 9.9 කින් පහළ වැටුණු අතර 2003 සිව්වන කාර්තුවේදී සියයට 1 ක මධ්‍යස්ථ වර්ධනයක් පමණක් වාර්තා කළේය.

2005 වන විට, රෙදිපිළි හා ඇඟළුම් පංගු ක්‍රමයෙන් නිදහස් වනු ඇත. ඉදිරියේදී ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවිශ්ඨ වීමේ යාන්ත්‍රනය ලෙස කටයුතු කරනු ලබනු ඇත්තේ තීරුබදු සහ කම්කරු ප්‍රමිතීන් වැනි තීරුබදු නොවන බාධකයන් පමණක් වනු ඇත. පංගු ක්‍රමය අහෝසිවීම සඳහා තව ඉතිරිව ඇත්තේ අවුරුද්දක පමණ කාලයක් පමණක් වන බැවින් පංගු රහිත වෙළෙඳපොළ පරිසරයට හැඩ ගැසීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු 2003 දී කඩිනම් කරන ලදී. ඵලදායිතාවය ඉහළ නැංවීම, නිෂ්පාදන පිරිවැය තාර්කීයකරණය, ශක්‍යතාවයන් ඇති කුඩා වෙළෙඳපොළවල් සොයා ගැනීම, නිෂ්පාදන ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම සහ තමන්ගේම සන්නම් ජනප්‍රිය කර ගැනීම සඳහා නිෂ්පාදකයන් පියවර ගෙන ඇත. කළමනාකාරිත්වය කාර්යක්ෂම කිරීම, නිෂ්පාදන විශේෂීකරණය සහ මහා පරිමාණ වාසි ලබා ගැනීම සඳහා සමහර ආයතන ඒකාබද්ධ වී තනි ආයතනයක් ලෙස කටයුතු කිරීමට පියවර ගෙන ඇත. මෙම තත්ත්වයන් යටතේ, විශාල ආයතන තම වෙළෙඳපොළ පිළිබඳ ඇති විශේෂ හැකියාවන්හි සාපේක්ෂ වාසි භාවිතා කරමින් ජාත්‍යන්තර වෙළෙඳපොළවල් වල අලෙවි කටයුතු හසුරුවනු ලැබූ අතර සමහර නිෂ්පාදන කටයුතු කුඩා පරිමාණ නිෂ්පාදකයින් වෙත පවරා දී ඇත.

නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවන් එකිනෙකට සම්බන්ධ කරන නවීන යන්ත්‍රසූත්‍ර භාවිතය සහ කර්මාන්තශාලා පරිශ්‍රය තුළම මැහුම්, ගෙතුම් සහ නිම කිරීම් කිරීමට හැකිවන නව තාක්ෂණය යොදා ගැනීම නිසා නිෂ්පාදකයින්ට තම නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වයේ

**4.6 රූප සටහන**
**ප්‍රධාන කාර්මික උපකාණ්ඩයන්හි ක්‍රියාකාරිත්වය**
**(1990 - ස්ථාවර මිල අනුව)**




ඒකමතිකභාවය සහ මිල තරඟකාරීත්වය පවත්වා ගැනීමට හැකිවිය. සැපයුම් ක්‍රියාදාම කළමනාකකරණයේ සිදු වූ ප්‍රගතිය තොගවල ආයෝජනය කර ඇති කාරක ප්‍රාග්ධනය, තොග මෙහෙයුම් පිරිවැය සහ ප්‍රවාහන කාලය අඩු කර ගැනීමට උපකාරී විය. ප්‍රධාන පෙලේ නිෂ්පාදකයින් හා අලෙවිකරුවන් රජය හා වෙළෙඳ සංගම් මගින් මහ පෙත් වූ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනවලදී නව ඇණවුම් ලබා ගැනීම සඳහා ක්‍රියාශීලී ලෙස සහභාගී විය. නිෂ්පාදකයින් ජාත්‍යන්තර ගැනුම්කරුවන් සමඟ ඇතිකරගෙන තිබූ සබඳතා තවදුරටත් ශක්තිමත් කරගත් අතර නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව ඉහළ කීර්තියක් හිමිකර ගෙන ඇති සමහර ජාත්‍යන්තර නිෂ්පාදකයින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයින් සමඟ හවුල් ව්‍යාපාර ආරම්භ කළේය. වරායෙන් භාණ්ඩ නිදහස් කරන කාලය අවම කර ගැනීම සඳහා ඇඟළුම් නිෂ්පාදකයින් වරාය අධිකාරිය හා රේගුව සමඟ එක්ව පියවර ගණනාවක් ගෙන ඇත.

ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ ගිවිස ගැනීමට අපේක්ෂිත වෙළඳාම් හා ආයෝජන සඳහා වන මූලික රාමුව පිළිබඳ ගිවිසුම (Trade and Investment Framework Agreement) යටතේ අපේක්ෂිත තීරු බදු සහනයන් සහ 2004 පෙබරවාරි සිට යුරෝපා සංගමයෙන් ලැබුණු විශේෂ තීරු බදු සහනයන් පංගු රහිත වෙළෙඳපොළ පරිසරයක් තුළ ශ්‍රී ලාංකික නිෂ්පාදනවල තරඟකාරීත්වය පවත්වා ගැනීමට'උපකාරී වනු ඇත. ඉන්දියාව සමඟ ඇතිකරගත් නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳව යලි සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඇති කරගත් නව කොන්දේසි යටතේ ඇඟළුම් පංගු ප්‍රමාණය දශ ලක්ෂ 2 සිට දශ ලක්ෂ 4 දක්වා වැඩි කර ගැනීමට හැකි වී ඇත. ඉන්දියාව සමඟ අත්සන් කිරීමට නියමිත විස්තීරණ ආර්ථික සහයෝගීතා ගිවිසුම (Comprehensive Economic Partnership Agreement) මගින් භාණ්ඩ හා සේවා එහා මෙහා ගෙන යාමට ඇති බාධක ලිහිල් කිරීමට සහ දෙරට අතර ආයෝජනය ඉහළ නංවා ගැනීමට අපේක්ෂිතය. ඇඟළුම් කර්මාන්තය හා සම්බන්ධ පසු පස බැඳීම් කර්මාන්තය වැඩිදියුණු කිරීමට උත්සාහයන් ගනු ලැබූ අතර ඉන්දියාව, පකිස්ථානය නැගෙනහිර ආසියාතික රටවල් ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය රෙදිපිළි ලබාගත හැකි රටවල් වශයෙන් භාවිතා කිරීමට අපේක්ෂා කරනු ලබයි.

**4.7 රූප සටහන**
**පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන ප්‍රමාණ දර්ශකය**
**(1977=100)**




ඇඟළුම් කර්මාන්තයේ අනාගත අභියෝගවලට සාර්ථක ලෙස මුහුණ දීම සඳහා රජය පෞද්ගලික අංශයේ ද සහාය ඇතිව පස් අවුරුදු උපාය මාර්ගික සැලසුමක් සකස් කොට ඇත. මෙම සැලසුමට අනුව වර්තමානයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 ක් වූ ඇඟළුම් අපනයන ප්‍රමාණය 2007 වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5 දක්වා වැඩි කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි. මෙම සැලසුමෙහි මූලික අරමුණු වන්නේ ඇඟළුම් නිෂ්පාදකයින් හුදු නිෂ්පාදකයන් වශයෙන් කටයුතු නොකොට ඒකාබද්ධ සේවා සපයන්නන් බවට පත් කිරීම, ඉහළ වටිනාකමක් සහිත භාණ්ඩ සැපයීම තුළින් වෙළෙඳපොළට ප්‍රවිෂ්ය වීම සහ ක්‍රීඩා ඇඳුම්, සාමාන්‍ය පහසු ඇඟළුම්, ළමා ඇඳුම් හා ඒ ආශ්‍රිත විශේෂිත නිෂ්පාදන අයිතමයන් සැපයීම සම්බන්ධව ජාත්‍යන්තරව පිළිගත් නිෂ්පාදකයන් බවට කීර්තියක් අත් කර ගැනීම වේ. පස් අවුරුදු සැලැස්මේ උපාය මාර්ග ඉදිරියට ගෙන යාම සඳහා උපකාරක සේවා, පසු පස සබඳතා ශක්තිමත් කිරීම, තාක්ෂණය ඉහළ නැංවීම, ශ්‍රමය, වෙළෙඳ ගිවිසුම්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය, ප්‍රතිරූප ගොඩ නැංවීම සහ මූල්‍ය ප්‍රතිසංස්කරණ, යන අංශ සඳහා කාර්ය සාධක බලකායන් අටක් පත් කර ඇත. ඇඟළුම් අංශයේ ඵලදායිතාව සහ තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ වැඩ පිළිවෙලක් ඇඟළුම් කරුවන්ගේ ඒකාබද්ධ සංසදය මගින් හඳුන්වා දීම සුදුසුයැයි 2004 අයවැය මගින් යෝජනා කර ඇත. ඇඟළුම් කර්මාන්තය ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය ප්‍රදානයන් ලබා දීම සහ මිනිස් බල පුහුණුව සහ සංවර්ධනය කිරීම සඳහා පොළී රහිත ණයක් ලබා දීම මෙම වැඩ පිළිවෙලට ඇතුළත් වේ.

2004 අවසානයේදී බහු කෙඳි වැඩපිළිවෙල යටතේ ඇඟළුම් පංගු ක්‍රමය අහෝසි වීමත් සමග ඇඟළුම් කර්මාන්තයට දැඩි අවදානම් තත්ත්වයකට සහ දැඩි ආයෝජන අභියෝගවලට මුහුණ දීමට සිදුවනවා මෙන්ම එය නව ආයෝජන අවස්ථාවන්ද උදා කරනු ලබයි. එබැවින් මෙම නව අවස්ථාවලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට සහ එල්ලවිය

**4.13 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන දර්ශකය**

1990=100

| කාණ්ඩය | දර්ශකය | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1999 | 2000 | 2001 | 2002 | 2003(අ) | 2002 | 2003(අ) |
| 1. **ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත** | **193** | **205** | **211** | **221** | **235** | **4.6** | **6.3** |
| ආහාර සහ වෙනත් | 207 | 218 | 225 | 235 | 252 | 4.4 | 7.1 |
| මත්පැන් | 199 | 203 | 208 | 219 | 245 | 5.2 | 12.0 |
| පාන වර්ග | 221 | 248 | 259 | 271 | 289 | 4.5 | 6.6 |
| දුම්කොළ නිෂ්පාදිත | 118 | 116 | 113 | 119 | 115 | 5.1 | -3.5 |
| 2. **රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත** | **289** | **335** | **306** | **310** | **319** | **1.2** | **2.7** |
| ඇඟළුම් | 322 | 375 | 343 | 348 | 357 | 1.3 | 2.6 |
| රෙදිපිළි | 198 | 224 | 205 | 212 | 216 | 3.5 | 1.8 |
| සම් භාණ්ඩ | 203 | 217 | 205 | 194 | 205 | -5.6 | 5.9 |
| 3. **දව හා දව නිෂ්පාදිත** | **168** | **178** | **180** | **177** | **187** | **-1.5** | **5.5** |
| 4. **කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත** | **292** | **314** | **324** | **316** | **330** | **-2.5** | **4.5** |
| 5. **රසායනික ද්‍රව්‍ය,ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත** | **299** | **326** | **318** | **333** | **370** | **4.8** | **11.1** |
| රසායනික ද්‍රව්‍ය, තීන්ත වර්ග සහ පොහොර | 258 | 292 | 282 | 294 | 311 | 4.4 | 5.9 |
| රබර් | 279 | 313 | 280 | 299 | 364 | 6.9 | 21.8 |
| ප්ලාස්ටික් සහ පීවීසී | 252 | 268 | 297 | 309 | 335 | 4.1 | 8.5 |
| ඖෂධ, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අනෙකුත් | 312 | 331 | 318 | 329 | 349 | 3.6 | 5.9 |
| 6. **ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත** | **288** | **294** | **296** | **301** | **320** | **1.9** | **6.1** |
| දියමන්ති සැකසීම | 274 | 281 | 274 | 288 | 308 | 4.9 | 6.9 |
| පිඟන් නිෂ්පාදන | 199 | 201 | 177 | 184 | 191 | 3.8 | 3.5 |
| සිමෙන්ති | 285 | 287 | 294 | 290 | 313 | -1.5 | 7.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත් | 257 | 268 | 279 | 283 | 295 | 1.5 | 4.2 |
| 7. **මූලික ලෝහ නිෂ්පාදිත** | **412** | **435** | **451** | **463** | **485** | **2.8** | **4.6** |
| 8. **සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ** | **208** | **217** | **222** | **226** | **242** | **2.0** | **6.7** |
| 9. **අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ)** | **280** | **292** | **296** | **302** | **323** | **2.0** | **6.9** |
| **සියළුම කාණ්ඩ** | **259** | **286** | **276** | **282** | **297** | **2.5** | **5.2** |

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

හැකි අවදානම් තත්ත්වයන් අවම කර ගැනීම සඳහා පුළුල් පෙර සූදානමක් තිබීම අවශ්‍ය වේ. තවද ගුණාත්මකභාවය, මිල, කඩිනමින් භාණ්ඩ සැපයීම, තමාගේම සන්නම් ජනප්‍රිය කර ගැනීම සහ හුදු නිෂ්පාදකයෙක් වශයෙන් පමණක් කටයුතු නොකොට ඒකාබද්ධ සේවා සපයන්නකු බවට පත්වීම අනාගත තරඟකාරීත්වය සඳහා මුහුණ දීමට උපකාරී වනු ඇත. ඉලක්ක ගත වෙළෙඳපොළවල ඇඟළුම් කර්මාන්තය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රචාරණ කටයුතු දියත් කිරීම සහ කම්කරුවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දැනට පවතින උසස් ප්‍රමිතීන් පිළිබඳව වැඩි ප්‍රචාරණයක් ලබා ගැනීම තරඟකාරී වෙළෙඳපොළවල් අත්පත් කර ගැනීමට උපකාරී වනු ඇත. තෝරා ගත් අයිතමයන් සම්බන්ධයෙන් විශේෂීකරණය කිරීම සහ එම විශේෂිත නිෂ්පාදන සඳහා සුවිශේෂී නිෂ්පාදකයකු වශයෙන් පිළිගැනීමක් ඇති කර ගැනීම දැනට පවතින වෙළෙඳපොළවල් වඩාත් ශක්තිමත් කර ගැනීම සඳහා ගත හැකි වැදගත් උපාය මාර්ගයක් වනු ඇත. ජාත්‍යන්තර මෝස්තර නිර්මාණකරුවන් සමඟ ව්‍යාපාර සබඳතා ගොඩ නගා ගැනීම සහ භාණ්ඩ අළෙවි කළ පසු ගැනුම්කරුවන්ගෙන් එම භාණ්ඩවල ගුණාත්මකභාවය පිළිබඳව අදහස් ලබා ගැනීම, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඉක්මනින් වෙනස්වන මෝස්තර පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට සහ ඒවා නිෂ්පාදනය කිරීමට උපකාරී වේ. 2005න් පසුව මුහුණ දීමට සිදුවන ඉහළ තරඟකාරී වෙළෙඳපොළ පරිසරයක් තුළ පිරිවැය අඩු කර ගැනීමට සහ තරඟකාරීත්වය වැඩි කර ගැනීමට නම් වඩාත් කාර්යක්ෂම විශාල පරිමාණයේ කර්මාන්තශාලා බවට පත්වීම හෝ ඉතා කුඩා කර්මාන්තශාලා බවට පත් වීම අවශ්‍ය වේ. එසේම කර්මාන්තය පසුපස සම්බන්ධතාවලින් දැඩි ලෙස ශක්තිමත් විය යුතුය. අනෙකුත් ආසියාතික රටවල මෙන් ශ්‍රී ලංකාවේ ස්ථාපිත රෙදිපිළි පදනමක් නොමැති බැවින් මෙය හැකි කඩිනමින් විසඳාගත යුතු කරුණක් වේ.

ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොලෙන් ලැබුණු ඇඟළුම් පංගු ප්‍රමාණය 2003 දී ඒකක මිලියන 393.8 දක්වා සියයට 9.3 කින් වැඩි විය. කැනේඩියානු වෙළෙඳපොළෙන් ලැබුණු පංගු ප්‍රමාණයද 2003 දී ඒකක මිලියන 15 දක්වා සියයට 11.9 කින් වැඩි විය. 2003 දී ශ්‍රී ලංකාව විවිධ ඇඟළුම් හා රෙදිපිළි අයිතම 30 ක් ඇමෙරිකානු එක්සත් ජනපද වෙළෙඳපොළට සහ අයිතම 11 ක් කැනේඩියානු වෙළෙඳපොළට ද අපනයනය කළේය. 2002 වර්ෂයේදී ඒකක දශ ලක්ෂ 257.2 වූ ඇමෙරිකානු එක්සත් ජනපද

වෙළෙඳපොළෙහි පංගු උපයෝජනය 2003 දී ඒකක දශ ලක්ෂ 262.6 දක්වා සියයට 2.1 කින් ආන්තික වශයෙන් වැඩි විය. කෙසේ වුවද 2003 දී ලැබුණු පංගු ප්‍රමාණය ඉහළ යාම නිසා පංගු උපයෝජන අනුපාතය 2002 දී සියයට 71.4 සිට 2003 දී සියයට 65.4 දක්වා පහත වැටී ඇත. වර්ෂය තුළදී සූට්, ගොතන ලද කමිස හා හැට්ට, සායවල් සහ කලිසම් සඳහා වූ පංගු උපයෝජනය සියයට 90 කට වඩා වැඩි විය. එක්සත් ජනපද වෙළෙඳපොළෙහි පැවති මන්දගාමී ක්‍රියාකාරීත්වය හේතුවෙන් ක්‍රීඩා ඇඳුම්, පොප්ලින් රෙදි හා වියන ලද රෙදි, අත් ආවරණ, සූට්කබා, සූට් නොවන කබා, සහ ආවරණ කබා යන අයිතමයන් සඳහා වූ පංගු උපයෝජනය සියයට 25 කට වඩා අඩු විය. 2002 වර්ෂයේ සියයට 32.8 ක් වූ කැනේඩියානු වෙළෙඳපොළහි තුළ පංගු උපයෝජන අනුපාතය 2003 දී සියයට 31.3 දක්වා ආන්තික වශයෙන් පහළ වැටුණි. කැනේඩියානු වෙළෙඳළෙහි වඩාත් ජනප්‍රිය පංගු අයිතමයන් වූයේ දිග හා කොට කලිසම් සහ යට ඇඳුම් ය. කබා, සිනිඳු ඇඳුම්, පිහිනුම් ඇඳුම්, ළමා ඇඟළුම් හා ඇඳ ඇතිරිලි සඳහා කැනේඩියානු වෙළෙඳපොළ තුළ පංගු උපයෝජනය සියයට 5 කට වඩා අඩු මට්ටමක පවතින.

1998 වර්ෂයේ සිට රෙදිපිළි ආනයනය ලිහිල් කිරීමෙන් පසුව යල් පැන ගිය තාක්ෂණය, පහළ ගුණාත්මක තත්ත්වය සහ නිෂ්පාදන සීමිත පරාසයක් තුළ පැවතීම හේතු කොට ගෙන සමහර දේශීය රෙදි, පිළි නිෂ්පාදකයන්ට ආනයන සමඟ තරඟ කිරීමේදී, තවදුරටත් අපහසුතාවලට මුහුණ දීමට සිදුවිය. මෙම ගැටළු විසඳීමට සහ ඇඟළුම් කර්මාන්තයේ ජාත්‍යන්තර තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා 1998 දී රජය මගින් රෙදිපිළි කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් දියත් කරන ලදී. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ සටහන යටතේ 2003 දෙසැම්බර් වන විට රෙදිපිළි නිෂ්පාදකයින් 130 කට වැඩි ප්‍රමාණයක් තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා වන නවීකරණ වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කර තිබුණි. ඇඟළුම් කර්මාන්තයේ අනාගත පුළුල් වීම සඳහා එහි පසු පස බැඳීම් කර්මාන්තවල සංවර්ධනය අත්‍යාවශ්‍ය වන බැවින් ඇඟළුම් කර්මාන්තය සඳහා වන පස් අවුරුදු උපාය මාර්ග සැලසුම ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා දැඩි අවධානයක් යොමු කර ඇත. මේ යටතේ රෙදිපිළි කර්මාන්තය සඳහා විශේෂයෙන් යොදා ගතහැකි ප්‍රදේශයක් ලෙස පූගොඩ, අනාගත සංවර්ධනය සඳහා හඳුනාගෙන ඇත. විදුලිය, ජලය, මාර්ග සහ ජල පිරිපහදු පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් පූගොඩ වැඩ බිමෙහි දැනටමත් පවතී. හොංකොං, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව හා යුරෝපා සංගමයේ රටවල්වල නිෂ්පාදකයින්ට, ශ්‍රී ලංකාවේ රෙදි කම්හල් පිහිටු වීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා ඇඟළුම් නිෂ්පාදකයින්ගේ ඒකාබද්ධ සංසදය, එම රටවල කර්මාන්ත සංගම් සමඟ සාකච්ඡා ආරම්භ කොට ඇත.

දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කර ගත් කර්මාන්තවල ඉහළ ක්‍රියාකාරීත්වය පිළිබිඹු කරමින් සම් භාණ්ඩ කර්මාන්තයේ නිමැවුම 2003 දී සියයට 5.9කින් වර්ධනය විය. ඉහළ තීරු බදු ආරක්ෂණය නිසා දේශීය වෙළෙඳපොළ ඉලක්ක කර ගත් පාවහන් කර්මාන්තය වාසි ලැබීය. මිල අඩු ආනයනික පාවහන්වලින් දේශීය පාවහන් කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා සෑම ආනයනික පාවහන් යුගලයක් සඳහාම අයකළ තීරු බද්ද රුපියල් 100 දක්වා වැඩි කරන ලදී. පාවහන් නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන අමු ද්‍රව්‍ය සඳහා වන තීරු බදු රජය මැතදී පහත දමන ලදී. පාරිභෝගිකයින්ගේ ජීවන තත්ත්වය උසස් වීමත් සමඟ මෑතක සිට දේශීය පාවහන් සඳහා ඉල්ලුම වැඩි වෙමින් පැවතිය ද නිෂ්පාදන ප්‍රමාණවත් ලෙස නවීකරණය නොවීම නිසා මෙම වාසි දායක තත්ත්වයේ නිසි ඵල නෙලා ගැනීම නොහැකි වී ඇත.

### ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත

2002 දී අත්කර ගත් සියයට 4.6 ක වර්ධනය හා සසඳන කළ 2003 දී ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයේ නිමැවුම සියයට 6.3 කින් වර්ධනය වූ අතර, එය කර්මාන්ත අංශයේ වර්ධනයට සියයට 31 කින් දායක විය. ආහාර සැකසුම් (සියයට 7.1), පාන වර්ග (සියයට 6.6) සහ මත්පැන් (සියයට 12.0) යන ප්‍රධාන උපකාණ්ඩවල නිමැවුමෙහි වර්ධනයක් වාර්තා විය. 2003 දී දුම්කොළ නිෂ්පාදන සියයට 3.5 කින් පහළ වැටුණි.

2003 දී ආහාර උප අංශයේ වර්ධනය සකස් කළ ආහාර, බිස්කට්, කිරි නිෂ්පාදිත, එළවළු හා පළතුරු සැකසුම්, සීනි සහ සත්ත්ව ආහාර, නිෂ්පාදනවල ඉහළ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් විය. ආහාර පුරුදු නොකඩවා වෙනස්වීම, සංචාරක ව්‍යාපාරයේ පිබිදීම සහ ක්ෂණික ආහාර සඳහා පාරිභෝගික ඉල්ලුම වර්ධනය වීම සකස් කළ ආහාර හා සකස් කළ මස් නිෂ්පාදිත සඳහා වන ඉල්ලුම ඉහළ යාමට ඉවහල් විය. පාරිභෝගික සමීක්ෂණයන්වල සොයා ගැනීම් පදනම් කරගනිමින් ප්‍රධාන නිෂ්පාදකයින් නව නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වා දීමට සහ පවත්නා නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය තව දුරටත් වැඩි දියුණු කිරීමට පියවර ගත්තා ලදී. මෙම දියුණුවත් සමඟ ප්‍රධාන පෙළේ නිෂ්පාදකයින් ඔවුන්ගේ නිෂ්පාදන ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සහ මාලදිවයින වැනි රටවලට ඔවුන්ගේම සන්නාම් යටතේ අපනයනය කිරීම ආරම්භ කර ඇත. දේශීය ඉල්ලුම ඉහළ යාම සහ නව විදේශ වෙළෙඳපොළවලට ප්‍රවිශ්ය වීමට හැකිවීම නිසා බිස්කට් නිෂ්පාදනය නොකඩවා වර්ධනය විය. නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය අඛන්ඩව වර්ධනය වීම, කුඩා ඇසුරුම් හඳුන්වා දීම හා බෙදා හැරීමේ ක්‍රමවල සිදු වූ දියුණුව බිස්කට් සඳහා වූ දේශීය ඉල්ලුම වැඩිවීමට ඉවහල් විය. ප්‍රධාන පෙලේ නිෂ්පාදකයින් විසින් දියත් කළ සිත් ඇද ගන්නා සුළු ප්‍රචාරණ වැඩ පිළිවෙලවල් දේශීය වෙළෙඳපොළ ප්‍රසාරණය වීමට උපකාරී විය.

කුකුල් පාලන කර්මාන්තයේ වර්ධනය සත්ත්ව ආහාර කර්මාන්තයේ අඛණ්ඩ වර්ධනයට හේතු විය. කිරි පිටි ඇසුරුම්

කර්මාන්තය 2003 දී සියයට 4.2 කින් වර්ධනය විය. ජාත්‍යන්තර මිල ගණන් ඉහළ යාම දේශීය වෙළෙඳපොළෙහි කිරිපිටි මිල ගණන් ඉහළ යාමට හේතු විය. එහෙත් සාධාරණ මිලකට නැවුම් කිරි ලබා ගැනීමට නොහැකි වීම, සීඝ්‍ර නාගරීකරණය සහ ආක්‍රමණශීලී ප්‍රචාරණ ක්‍රමවලට ප්‍රතිචාර දක්වමින්, දේශීය වෙළෙඳපොල තුළ කිරිපිටි ඉල්ලුම තව දුරටත් ඉහළ ගියේය. වසර තුළදී විවිධ නම් සහිත කිරිපිටි වර්ග ගණනාවක් වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. දේශීයව නිෂ්පාදනය කළ කිරිපිටි නිමැවුම 2003 දී මධ්‍යස්ථ වශයෙන් පමණක් වර්ධනය විය. ප්‍රමාණවත් තරම් නැවුම් කිරි ලබාගැනීමට නොහැකි වීම දේශීය කිරිපිටි නිෂ්පාදනයේ වර්ධනය සඳහා පැවති ප්‍රධාන සංරෝධකයක් විය. සංචාරක ව්‍යාපාරයේ පිබිදීමත් සමඟ හෝටල් හා බේකරිවලින් ඇති වූ ඉහළ ඉල්ලුම නිසා 2003 දී බටර්, චීස් සහ අයිස් ක්‍රීම් වැනි අනෙකුත් කිරි නිෂ්පාදන සඳහා පැවති ඉල්ලුම ද ඉහළ ගියේය.

නිෂ්පාදන බදු ඉහළ යාම නිසා මිල ඉහළ ගිය තත්ත්වයන් හමුවේ වුවද සිසිල් බීම කර්මාන්තය අඛණ්ඩව වර්ධනය විය. සටන් විරාමයත් සමඟ යුද්ධය පැවති ප්‍රදේශවල වෙළෙඳපොළවලට පිවිසීමට හැකිවීම සිසිල් බීම කර්මාන්තය වර්ධනය සඳහා උපකාර විය. කර්මාන්තශාලාවන් තුළ කාර්යක්ෂම කළමනාකරණ ශිල්ප ක්‍රම අනුගමනය කිරීම සහ වඩාත් යෝග්‍ය වැඩ රටාවන් ක්‍රියාවට නැංවීම නිෂ්පාදන ප්‍රමාණය වර්ධනය වීමට උපකාරී විය. සුරා බදු ඉහළ ගියද දේශීය හා විදේශීය වෙළෙඳපොළෙහි ඉල්ලුම වැඩිවීම නිසා 2003 දී බියර් හා සැර මත්පැන් කර්මාන්තය සියයට 12.0 කින් වර්ධනය විය. බෙදා හැරීමේ ක්‍රම ශක්තිමත් කර ගැනීම හා ඇසුරුම් වැඩි දියුණු කිරීම නිසා මාලදිවයින, එක්සත් රාජධානිය, ජපානය, ඔස්ට්‍රේලියාව හා ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල වෙළෙඳපොළ කොටස වඩාත් ශක්තිමත් කර ගැනීමට බියර් නිෂ්පාදකයින්ට හැකි විය. බෝතල් සහ ඇසුරුම් සඳහා නව අංගයන් හඳුන්වා දීම සහ සුරා බදු නීතිරීති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම බලය ලත් මත්පැන් නිෂ්පාදකයින්ට අනුකරණවල අහිතකර බලපෑම් යම්තාක් දුරකට අඩුකර ගැනීමට උපකාරී විය. මෑතකදී දුම්කොළ නිෂ්පාදන සඳහා හඳුන්වා දුන් බදු සංශෝධනයෙන් පසුව නීති විරෝධී නිෂ්පාදන නිසා අහිමි වූ තම වෙළෙඳපොළ කොටස නැවත අත්පත් කර ගැනීමට බලපත්‍රලාභී සිගරට් නිෂ්පාදකයින්ට හැකිවිය. කෙසේ වුවද දුම්කොළ ආශ්‍රිත සෞඛ්‍ය ගැටළු පිළිබඳව දැනුවත් භාවය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස දුම්කොළ නිෂ්පාදිත සඳහා වූ සමස්ථ ඉල්ලුම 2003 දී සියයට 3.5 කින් පහත වැටුණි.

2003 දී පළතුරු හා එළවළු සැකසුම් කර්මාන්තයේ නිමැවුම සියයට 8.0 කින් පමණ වර්ධනය විය. පළතුරු හා එළවළු එහා මෙහා ගෙනයාමට, මෑතදී හඳුන්වා දුන් ප්ලාස්ටික් ඇසුරුම් හා අනෙකුත් ඇසුරුම් ද්‍රව්‍ය එම කර්මාන්තයේ අපතේ යාම් අඩුවීමට උපකාරී විය. අපනයන ඉල්ලුම ඉහළ යමින් පැවතිය ද අක්‍රමවත් සැපයුම් තත්ත්වය හා අපනයනට සුදුසු පරිදි නිෂ්පාදන උසස් තත්ත්වයක නොතිබීම නිසා පළතුරු හා එළවළු වර්ග කිහිපයක් පමණක් දැනට අපනයනය කරනු ලබයි.

## රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත

2002 දී අත්කර ගත් සියයට 4.8 ක වර්ධනය හා සසඳන කළ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩයේ නිමැවුම 2003 දී සියයට 11.1 කින් වර්ධනය විය. මෙම නිෂ්පාදන කාණ්ඩය 2003 දී පෞද්ගලික අංශයේ කර්මාන්ත වල නිමැවුම් වර්ධනයෙන් සියයට 28 ට දායක විය. රබර් ආශ්‍රිත නිෂ්පාදන (සියයට 21.8), රසායනික ද්‍රව්‍ය සහ පොහොර (සියයට 5.9), ප්ලාස්ටික් හා පී.වී.සී (8.5) සහ ඖෂධ හා සනීපාරක්ෂක ද්‍රව්‍ය (සියයට 5.9) යන ප්‍රධාන උපකාණ්ඩයන්හි නිමැවුමෙහි ඉහළ වර්ධනයක් වාර්තා විය.

විශේෂයෙන්ම චීනයෙන් සහ මැලේසියාවෙන් දැඩි මිල තරඟයක් එල්ල වුවද රබර් ආශ්‍රිත කර්මාන්ත 2003 දී සියයට 21.8 කින් වර්ධනය විය. ඉරාක යුද්ධයෙන් පසුව ඉල්ලුම වැඩි වීම නිසා රබර් අත්වැසුම් හා ටයර් සඳහා වැඩි ඇණවුම් ප්‍රමාණයක් ලැබුණි. වෛද්‍ය නොවන කටයුතු සඳහා භාවිතා කරන අත්වැසුම් සඳහා 2001 දී පරීක්ෂණ හා තහවුරු කිරීමේ සහතිකයක් ලැබීම විදේශ වෙළෙඳපොළ සමඟ සෘජු අලෙවිකරණ සම්බන්ධතා ගොඩ නංවා ගැනීම සහ යුරෝපයේ ප්‍රධාන බෙදා හැරීමේ ජාලයක පාලන අයිතිය ශ්‍රී ලාංකික නිෂ්පාදකයකු විසින් අත්පත් කර ගැනීම යුරෝපා වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා නිෂ්පාදන ජනප්‍රිය වීමට උපකාරී විය. වසර තුළදී අපනයන මිල ගණන් ඉහළයාම සහ යුරෝ මුදල් අති ප්‍රමාණය වීම නිසා යුරෝපා සංගමයට තම නිෂ්පාදන අපනයනය කරන රබර් අත්වැසුම් නිෂ්පාදකයන් වාසි ලැබීය.

ඉන්දු-ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ 2003 දී රේගු බදු සම්පූර්ණයෙන් ඉවත් කිරීම නිසා වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා ටයර් නිෂ්පාදකයින්ට තම ඉන්දියානු වෙළෙඳපොළ කොටස තව දුරටත් ශක්තිමත් කර ගැනීමට හැකි විය. ටයර් නිෂ්පාදකයින් 2003 දී ඔවුන්ගේ වෙළෙඳපොළ සාර්ක් කලාපයේ රටවල මෙන්ම අනෙකුත් ආසියානු හා අප්‍රිකානු රටවල් දක්වා ව්‍යාප්ත කළේය. උතුරු ප්‍රදේශය විවෘත කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යාම හේතු කොට ගෙන අභ්‍යන්තර ප්‍රවාහන අවශ්‍යතා සීඝ්‍රයෙන් ඉහළයාම නිසා විශේෂයෙන්ම වාණිජ කටයුතු සඳහා භාවිතා කරන වාහන සඳහා වූ ටයර්, බයිසිකල් ටයර් හා ටියුබ් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි රබර් ටයර් සහ අත්වැසුම් මිල ගණන් ඉහළ යාම දේශීය වෙළෙඳ පොළෙහි රබර් කිරි මිල ගණන් ඉහළ යාමෙන් ඇති වූ අහිතකර බලපෑම යම් තරමක් දුරකට සමනය කර ගැනීමට සහ නැගෙනහිර ආසියාතික තරඟකරුවන්ගෙන් එල්ල වූ පීඩනය ලිහිල් කර ගැනීමට උපකාරී විය.

දේශීය ඉල්ලුම වර්ධනය වීම සහ ආනයනික භාණ්ඩවලට සාපේක්ෂව පැවති මිල වාසිය හේතු කොට ගෙන 2003 දී

සබන් හා සනීපාරක්ෂක ද්‍රව්‍යවල නිමැවුම සියයට 5.9 කින් වර්ධනය විය. රෙදි සෝදන යන්ත්‍රවල භාවිතය ඉහළ යාම, රෙදි සෝදන කුඩු සඳහා පැවැති ඉල්ලුම වැඩි වීමට හේතු විය. වසර තුළදී සැලකිය යුතු අඩු මිල ගණන් යටතේ සනීපාරක්ෂක ද්‍රව්‍ය රැසක් වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. ශාකශාර නිෂ්පාදන සඳහා ජනප්‍රියත්වය වර්ධනය වීම සහ එම නිෂ්පාදනවල සහ ඇසුරුම්වල ගුණාත්මක තත්ත්වය ඉහළ යාම නිසා දේශීයව නිෂ්පාදනය කරන සබන්, දන්තාලේප සහ ආලේපන වැනි ශාකශාර නිෂ්පාදන සඳහා පැවති ඉල්ලුම ඉහළ ගියේය. ඉන්දියාවෙන් ආනයනය කළ ශාකශාර නිෂ්පාදනවලින් එල්ල වූ තරඟයට සාර්ථකව මුහුණ දීමට කර්මාන්තයට හැකි විය.

2003 දී ප්ලාස්ටික් කර්මාන්තය සියයට 8.5 කින් වර්ධනය විය. මිල සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතීම සහ භාවිතයේ පහසුව නිසා ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ සහ ඇසුරුම් ද්‍රව්‍ය සඳහා පැවැති ඉල්ලුම වැඩි විය. දේශීය ඉල්ලුම වර්ධනය වීමට අමතරව විදේශීය ඉල්ලුම විශේෂයෙන්ම ඉන්දියාවෙන් ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ සඳහා ලැබුණු ඉල්ලුම වර්ධනය විය. 2003 දී රසායනික නිෂ්පාදන උප කාණ්ඩයෙහි, තීන්ත රසායනික ද්‍රව්‍ය, කෘමි නාශක සහ මදුරු දහර නිෂ්පාදනය වර්ධනය විය. ප්‍රමාණවත් තරම් පොල් කටු ලබා ගැනීමට නොහැකි වීම සහ අන්තර්ජාතික වෙළෙඳපොළෙහි පැවැති දැඩි තරඟකාරීත්වය 2003 දී සක්‍රිය කාබන් නිෂ්පාදනය පහත වැටීමට හේතු විය.

## ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන

සිමෙන්ති, සැකසූ දියමන්ති, සෙවිලි තහඩු හා කොන්ක්‍රීට් නිෂ්පාදනයන්ගේ ඉහළ ක්‍රියාකාරීත්වය නිසා 2003 දී ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කාණ්ඩයේ නිමැවුම සියයට 6.1 කින් වර්ධනය විය. 2003 දී ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීමත් සමඟ නිවාස සහ වාණිජ කටයුතු සඳහා යොදා ගැනෙන ගොඩනැගිලි ඉදි කිරීම් වර්ධනය වීම හේතුවෙන් සෙවිලි තහඩු, වීදුරු, ඇස්බැස්ටෝස් හා කොන්ක්‍රීට් නිෂ්පාදන සඳහා පැවති දේශීය ඉල්ලුම ඉහළ ගියේය. චීනය හා නැගෙනහිර ආසියාතික රටවලින් අළුතින් ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවිශ්ඨ වූ අඩු පිරිවැය නිෂ්පාදකයින් නිසා පිඟන් භාණ්ඩ නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ දැඩි තරඟකාරීත්වයක් ඇතිවිය. පෝසිලේන් පිඟන් භාණ්ඩ, බිත්තිවලට හා බිමට යොදන පෝසිලේන් පිඟන් ගඩොල් සහ විවිධ වර්ගයේ විසිතුරු පිඟන් භාණ්ඩ වැනි උසස් තත්ත්වයේ භාණ්ඩ රැසක් ශ්‍රී ලංකාව අපනයනය කරනු ලබන අතර කුඩා විශේෂිත වෙළෙඳපොළවල් අත්පත් කර ගෙන ඇත. ඉතා හොඳ පුහුණුවක් සහිත ශ්‍රම බලකායක් පැවතීම, ශ්‍රම පිරිවැය සාපේක්ෂ වශයෙන් තරඟකාරී වීම සහ නවීන මෝස්තර භාවිතා කිරීම වැනි ඉහළ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයක් කර්මාන්තය සතුව පවතී. ප්‍රමුඛ පෙළේ පිඟන් භාණ්ඩ නිෂ්පාදකයින් ඔවුන්ගේ සන්නාම නාමයන් දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ තුළද ඉතා හොඳින් තහවුරු කර ගෙන ඇත. පරිසර හිතකාමී ස්වභාවික නිෂ්පාදන භාවිතය පිළිබඳව දැඩි නැඹුරුවක් ඇතිවීමත් සමඟ පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනය සඳහා බටහිර වෙළෙඳපොළ තුළ ඉහළ ශක්‍යතාවයක් පවතී.

උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතු ආරම්භවීම සිමෙන්ති සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම වැඩි වීමට ඉවහල් විය. සිමෙන්ති නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ක්ලින්කර් සඳහා වූ තීරු බදු අඩු වීම සහ ඩොලරයට සාපේක්ෂව රුපියල සුළු වශයෙන් පමනක් අවප්‍රමාණය වීම සිමෙන්ති කර්මාන්තයට වාසිදායක විය. පාරිභෝගික අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වමින්, ප්‍රධාන පෙළේ සිමෙන්ති නිෂ්පාදකයන් 2003 දී නව නිෂ්පාදන කිහිපයක් වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා වීදුරු කර්මාන්තය සැලකිය යුතු මුදලක් ආයෝජනය කර ඇත. වීදුරු කර්මාන්තයේ මෙම දියුණුවත් සමඟ ප්‍රමුඛ පෙළේ බියර් නිෂ්පාදකයින් සඳහා තත්ත්වයෙන් උසස් වීදුරු බෝතල් සැපයීමට කර්මාන්තයට හැකි වී ඇත.

## සකස් කළ ලෝහ නිෂ්පාදිත

පසුගිය වසරේ අත්කර ගත් සියයට 2 ක වර්ධනය හා සසඳන කළ 2003 දී සකස් කළ ලෝහ නිෂ්පාදිතවල නිමැවුම සියයට 6.7 කින් වර්ධනය විය. 2003 දී මෙම නිෂ්පාදන කාණ්ඩය කම්හල් කර්මාන්ත නිමැවුමේ වර්ධනයට සියයට 6 කින් දායක විය. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, විදුලි රැහැන්, වතුර පොම්ප, මුළුතැන්ගෙයි උපකරණ, යතුරු පැදි එකලස් කිරීම සහ නැව් හා බෝට්ටු සකස් කිරීම සහ ඇළුමිනියම් හා විදුලි උපාංග වැනි උප අංශ වල නිමැවුමෙහි ඉහළ වර්ධනයක් වාර්තා විය. 2003 දී බැටරි හා බස් රථ බොඩි සැකසීමේ කර්මාන්තවල නිමැවුම පහළ වැටුණි.

ඉදි කිරීම් කර්මාන්තය පුළුල් වීම නිසා 2003 දී ඇලුමිනියම් නිෂ්පාදිත, විදුලි රැහැන් සහ විදුලි උපාංග සඳහා ඉහළ ඉල්ලුමක් ජනිත විය. මිල, කල්පැවැත්ම, පරිහරණයේ පහසුව හේතු කොට ගෙන ඉදි කිරීම් කර්මාන්තය තුළ ඇළුමිනියම් ජනෙල් රාමු සහ වානේ නිෂ්පාදන භාවිතය ජනප්‍රිය වෙමින් පවතී. නැව් සැකසීමේ සහ අළුත් වැඩියා කිරීමේ කර්මාන්තයේ නිමැවුම 2003 දී සියයට 5.5 කින් වර්ධනය විය. කර්මාන්තය වර්ෂය තුළදී යටිතල පහසුකම්, තාක්ෂණය හා නිපුනතාවයන් අඛණ්ඩව ඉහළ නංවාගෙන ඇත. 2003 දී යතුරු පැදි එකලස් කිරීමේ කර්මාන්තය සියයට 15 කින් වර්ධනය විය.

ග්‍රාමීය ප්‍රදේශ වලට විදුලිය ලැබීම සහ එම ප්‍රදේශවල ආදායම් තත්ත්වය ඉහළ යාම හේතුවෙන් රූපවාහිනී යන්ත්‍ර, විදුලි උපකරණ සහ මුළුතැන් ගෙය උපකරණ සඳහා වන ඉල්ලුම ඉහළ ගියේය. සටන් විරාමයත් සමඟ යුද්ධය පැවති ප්‍රදේශවලින් ඇති වූ නව ඉල්ලුම ද මෙම කර්මාන්තයේ වර්ධනයට උපකාරී විය. යහපත් කාලගුණික තත්ත්වය සමඟ ඉහළ ගිය කෘෂිකාර්මික කටයුතු නිසා කෘෂිකාර්මික යන්ත්‍ර

**4.14 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය**

1997=100

| කාණ්ඩය | දර්ශකය | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1999 | 2000 | 2001 | 2002 | 2003(අ) | 2002 | 2003(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 106.5 | 139.8 | 128.1 | 91.8 | 121.1 | -28.3 | 31.9 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | - | - | - | - | | | |
| 3. දව හා දව නිෂ්පාදිත | 126.5 | 213.3 | 127.9 | 143.8 | 136.2 | -12.4 | -5.3 |
| 4. කඩදසි හා කඩදසි නිෂ්පාදිත | 38.2 | 29.6 | 40.6 | 26.0 | 12.8 | -36.0 | -50.8 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 84.4 | 104.9 | 93.0 | 101.6 | 94.3 | 9.2 | -7.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 84.4 | 104.9 | 93.2 | 101.1 | 93.8 | 8.5 | -7.2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 70.5 | 82.6 | 83.4 | 86.7 | 94.8 | 4.0 | 9.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | - | - | - | - | - | - | - |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - | - | - |
| සියළුම කාණ්ඩ | 83.1 | 103.2 | 91.5 | 98.4 | 91.4 | 7.5 | -7.1 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර | 68.5 | 82.8 | 78.0 | 61.0 | 63.2 | -21.8 | 3.6 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

හා වතුර පොම්ප සඳහා වූ ඉල්ලුම ඉහළ ගියේය. සිසිල් බීම සහ සකස් කළ ආහාර කර්මාන්තයන්ගේ වර්ධනය ශීතකරණ සඳහා පැවති ඉල්ලුම ඉහළ යාමට හේතු විය. බටහිර රටවලින් ලැබුණු ඉහළ අපනයන ඇණවුම් නිසා විද්‍යුත් නිෂ්පාදන හා විදුලියන්ත්‍රවල නිෂ්පාදනය වැඩි විය. 2003 දී දේශීය ඉල්ලුම අඩු වීමේ හේතුවෙන් බස් රථ සකස් කිරීමේ කර්මාන්තයේ නිමැවුම පහළ වැටුණි.

### අනෙකුත් නිෂ්පාදන

රැළි සහිත කඩදාසි, කඩදාසි හා කඩදාසි මළු, ඡායා රූප ඇල්බම්, ලිපි ගොනු කවර, ඇසුරුම් ද්‍රව්‍ය, තැගි භාණ්ඩ ඇසුරුම් කවර, ස්ටිකර්, කුඩා පොත් සහ කඩදාසි පුවරු ආදී නිෂ්පාදන සඳහා අපනයන ඉල්ලුම වැඩිවීම නිසා කඩදාසි හා කඩදාසි නිෂ්පාදන සියයට 4.5 කින් වර්ධනය විය. ලිපි ලිවීමට භාවිතා කරන පොත්, අත් පත්‍රිකා, ලේබල් සහ අභ්‍යාස පොත් ආදී දේශීය වෙළෙඳපොළ පදනම් කොට ගත් කඩදාසි නිෂ්පාදනයන් ද 2003 දී සාපේක්ෂ වශයෙන් ඉහළ වර්ධනයක් වාර්තා කළේය. දේශීයව නිෂ්පාදනය කළ රැළි සහිත කඩදාසි, ලේබල හා ඇසුරුම් සඳහා වූ කඩදාසි පෙට්ටි, අපනයනය හා බැඳුන කර්මාන්ත ලෙස සංවර්ධනය විය. මූලික යටිතල පහසුකම් සපයමින් මුද්‍රණ කටයුතු සඳහා විශේෂයෙන් වෙන් වූ ප්‍රථම කාර්මික උද්‍යානය රජය විසින් බස්නාහිර පළාතේ පිහිටුවීමට පියවර ගන්නා ලදී.

අපනයන ඉහළ යාමත් සමඟ 2003 දී දැව හා දැව නිෂ්පාදන කාණ්ඩයේ නිමැවුම් සියයට 5.5 කින් වර්ධනය විය. අපනයනය කළ ප්‍රධාන දැව භාණ්ඩ වූයේ ක්‍රීඩා උපකරණ, අධ්‍යාපනික උපකරණ, දැවමය, සෙල්ලම් බඩු, විසිතුරු භාණ්ඩ හා දැව අත්කම් භාණ්ඩ හා තැගි භාණ්ඩය. සංචාරක කර්මාන්තයේ පිබිදීම, දැවමය, විසිතුරු භාණ්ඩ සඳහා ඉල්ලුම වැඩි වීමට හේතු විය. කෙසේ වුවද වානේ හා ප්ලාස්ටික් ගෘහ භාණ්ඩයන්හි පැවති මිල වාසිය හේතුකොට ගෙන පාරිභෝගිකයින් ඒවාට වැඩි කැමැත්ත දැක්වීම නිසා දේශීය වශයෙන් නිෂ්පාදනය කළ දැව ගෘහ භාණ්ඩ සඳහා

**4.8 රූප සටහන**

**කාර්මික නිෂ්පාදනය තුළ පෞද්ගලික හා රාජ්‍ය අංශය සතු කොටස**




වූ ඉල්ලුම වර්ධනය වූයේ මධ්‍යස්ථ වශයෙන් පමණි. යුරෝපීය හා නැගෙනහිර ආසියාතික රටවලින් ගෘහ භාණ්ඩ ආනයනය කිරීම, දේශීය ගෘහ භාණ්ඩ කර්මාන්තය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළේය. දැව ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමට නොහැකි වීම සහ පුහුණු ශ්‍රමයෙහි හිඟකම දැව කර්මාන්තයේ ව්‍යාප්තිය කෙරෙහි බලපාන සංරෝධකයන් බවට පත්වෙමින් පවතී.

### රාජ්‍ය අංශයේ කර්මාන්ත

2002 දී සියයට 7.5 කින් වර්ධනය වූ රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම 2003 දී සියයට 7.1 කින් අඩු විය. රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි සමස්ථ නිමැවුම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, නිතිපතා කෙරෙන නඩත්තු කටයුතු සඳහා ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තෙල් පිරිපහදුව 2003 දී මාසයක පමණ කාලයක් වසා තැබීමය. රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයකට දායක වන ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ නිමැවුම 2003 දී සියයට 7.2 කින් පහත වැටුණි. ඛනිජ තෙල් නිෂ්පාදිත හැරුණ විට රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම 2003 දී සියයට 3.6 කින් ඉහළ ගියේය.

ඵලදායිතාව ඉහළ යාම සහ උක් වගා කරනු ලැබූ ප්‍රදේශවල පැවැති යහපත් කාලගුණික තත්ත්වය නිසා උක් දඬු වලින් ලබා ගත හැකි වූ සීනි ප්‍රමාණය ඉහළ යාම නිසා 2003 දී සෙවනගල සීනි කර්මාන්තශාලාවේ නිෂ්පාදනය සියයට 37 කින් ඉහළ ගියේය. පොල්, තේ, රබර් හා වී අංශ වලින් පොහොර සඳහා පැවති ඉල්ලුම ඉහළ යාම නිසා 2003 දී ලංකා ෆොස්ෆේට් සමාගමේ නිමැවුම සියයට 12 කින් වර්ධනය විය. අස්වනු නෙලා ගන්නා කාලයේදී යහපත් කාලගුණික තත්ත්වයක් පැවතීම ලුනු නිෂ්පාදනය වැඩි වීමට ඉවහල් විය. ලංකා විදුලිබල මණ්ඩලයෙන් සහ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් විදුලි කනු සහ සිල්බර කඳන් සඳහා පැවැති ඉල්ලුම අඩුවීම රාජ්‍ය දැව සංස්ථාවේ නිමැවුම අඩුවීමට හේතුවිය.